
# 2013 වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report



රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்
State Printing Corporation

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்
STATE PRINTING CORPORATION

වාර්ෂික වාර්තාව, ගිණුම් ප්‍රකාශන සහ විගණකාධිපතිගේ වාර්තාව


# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# 2013

# වාර්ෂික වාර්තාව

2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ 46 වෙනි වසර සඳහා

**2013 ජනවාරි මස 01 වෙනි දින සිට**
**2013 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා**



# දැක්ම

මුද්‍රණ කර්මාන්තයේ ප්‍රමුඛයාවීම සමගින්
ප්‍රකාශනයෙන් විශේෂයෙන්
අධ්‍යාපන සංවර්ධන ප්‍රකාශනයෙන්,
සුරක්ෂා මුද්‍රණ කර්මාන්තය,
අභ්‍යාස පොත් හා ලිපිද්‍රව්‍ය
නිෂ්පාදන වෙළඳපොලේ පුරෝගාමියා වීම.

# මෙහෙවර

දක්ෂ, නිපුණ, ධෛර්යමත් හා තෘප්තිමත්
සේවක මණ්ඩලයකින් සමන්විත
ආදර්ශමත් රාජ්‍ය සංස්ථාවක් ලෙස
මුද්‍රණ කර්මාන්තයේ උසස්ම ප්‍රමිතියට අනුව
තරඟකාරී මිලකට මුද්‍රිත නිෂ්පාදන
ජනතාවගේ අවශ්‍යතාවය හා උන්නතිය සඳහා
සැපයීමට කැපවෙනු ඇත.

පානළුව,
පාදුක්ක.

ගරු පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
අංක 163, කිරුළපන මාවත
කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වෙනි වගන්තියේ කොන්දේසිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය ආවරණය කෙරෙන,

01. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව

02. ගණන් පරීක්ෂණයට භාජනය කරන ලද ශේෂ පත්‍රය, කාරක ගිණුම් හා ලාභ - අලාභ ගිණුම්

03. විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම

ඔබතුමාගේ දැන ගැනීම සඳහා මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී
රවින්ද්‍ර යසලාල් කලන්සූරිය
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව



# සභාපතිතුමාගේ පණිවුඩය

ආසියාව තුළ මුද්‍රණ කර්මාන්තයේ දැවැන්තයා ලෙස 1968 වර්ෂයේ සිට මොහොතින් මොහොත ඉදිරි පියවර තබමින් වර්ෂ 45 ක කාල පරාසය තුළ බාධක පරයමින් පැමිණි ඉදිරි ගමන්මග දෙස විමසා බැලීමේදී නිමා වූ තවත් කාල පරාසයක් වෙනුවෙන් සැකසෙන 2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ලාභදායීත්වය මෙන්ම කාර්යක්ෂමතාවය තවදුරටත් ආරක්ෂා කර ගනිමින් දේශය හමුවේ තැබීමට හැකිවීම පිළිබඳව මා සතුටට පත්වෙමි.

යහපාලනය පෙරදැරිකරගත් සම්මුතිවාදී පාලනයක් කරා පෙර ගමන් තැබූ අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අභිනව රාජ්‍ය පාලනය යථාර්ථයක් කිරීම පිණිස අපට දායකත්වය සැපයීමට හැකිවීම අපගේ මෙන්ම දේශයේ ඉදිරි ගමන සඳහා අත්වැලක් වනු නොඅනුමානය. සමාජය විසින් අනුමත නොකරන්නා වූ ව්‍යාපාරික ලෝකය තුළට අනුගත වී පවතින අල්ලස, වංචාව, දූෂණය පිටුදකිමින් සමාජ යහපත උදෙසා විනිවිද දකින පරිදි මෙහෙයවන පිරිසිදු ව්‍යාපාරික අවස්ථා ගොඩනැංවීම තුළ මෙතෙක් පවත්වාගෙන ආ ක්‍රමවේදය වඩාත් වේගයෙන් පෙරට ගෙනයාම සඳහා සූදානම් මොහොතක පසුගිය කාල පරාසය වෙනුවෙන් සංස්ථාවේ ගමන්මග හෙළි කෙරෙන වාර්ෂික විශ්ලේෂණය ඉදිරිපත් වීම ද සතුටකි.

යුග ගණනාවක් තුළ පැවති විවිධ හැලහැප්පීම්, බාධක, වැටකඩුලු පරයමින් තවදුරටත් උඩුගංබලා පිහිනන මොහොතක තරගකාරී වෙළෙඳපළ තුළ හුදෙකලා වූ තැන් නිවැරදි කරමින් ආසියාවේ දැවැන්තයා ලෙස ලද විරුදාවලිය අනාගතය තුළ මිහිකත සඳහා දැවැන්තයකු බිහිකරන සිහිනයක් සහිත ගමනක් සඳහා පියවර ආරම්භ කර ඇති මොහොතක එම ගමන්මග සාර්ථක කරන්නට යුගයේ විශිෂ්ට මෙහෙවර වෙනුවෙන් කැපවූ යහපාලන සම්මුතිවාදී රාජ්‍ය පාලනයේ ප්‍රධාන මෙහෙයුම්කරු අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ආදරයෙන් ගෞරවයෙන් සිහිපත් කරමි. එසේම එතුමන්ගේ සෙවණ හා ආශීර්වාදය තුළින් අප ගමන්මග එළිපෙහෙළි කරන්නට නිතිපතා දායකත්වය සපයමින් අප නිසි මගට යොමු කළ ගරු පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ කටයුතු හා ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

සංස්ථාවේ අරමුණ වෙනුවෙන් නැගෙන පියවර සඳහා අත්වැලක් සපයමින් ආයතනයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරමින් යා යුතු නිවැරදි දිසාව තෝරා බේරා දෙමින් අප කෙරේ විශ්වාසයෙන් කටයුතු කරන අමාත්‍යාංශ ලේකම් වජිර නාරම්පනාව මැතිතුමා සහ අප සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෙට දින ගොඩනගන්නට මා වෙත ලබා දුන් ශක්තිය ද ගෞරවයෙන් සිහිපත් කරන අතර, ආසියාවේ දැවැන්තයාගේ ගමන්මගට ශක්තිය දෙමින් සාමූහික හැඟීමෙන් අත්වැල් ගැටගසා ශක්තිමත් අත්වැලක් තනා ඇති සංස්ථාවේ සමස්ත සේවක මඩුල්ලට ද මාගේ අවංක ස්තුතිය පිරිනමමි.

**රවින්ද්‍ර යසලාල් කලන්සූරිය**
**සභාපති**
**රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව**

# 2013

# අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති

ජයම්පති බණ්ඩාර හීන්කෙන්ද මහතා

උප සභාපති

එච්. කේ. ඩී. ලක්ෂ්මන් ගාමිණී මහතා

අධ්‍යක්ෂ

1. අමරපාල ගමගේ මහතා
2. ඩී. ජී. එන්. කුමාරි මිය
3. එන්. එච්. එම්. චිත්‍රානන්ද මහතා
4. නන්දසිරි කළුබෝවිල මහතා
5. රාජනී අතපත්තු මිය
   (2013. 07. 02 දින සිට පත් කරන ලදී.)

2013

# විධායක නිලධාරී මණ්ඩලය

සාමාන්‍යාධිකාරී
**ආර්. එම්. එන්. මොණරවිල මහතා**

මුදල් කළමනාකරු
**එන්. ඩී. ප්‍රියංකර කුමාර මහතා**
සැපයුම් කළමනාකරු
**ඊ. වී. කේ. කීර්තිරත්න මහතා**
කළමනාකරු (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)
**ආර්. එම්. යූ. ඩී. බණ්ඩාර මහතා**
වැඩ කළමනාකරු
**එස්. ටී. කරුණාරත්න මහතා**
අලෙවි කළමනාකරු
**එම්. ටී. ජේ. පෙරේරා මහතා**
කළමනාකරු (මෙහෙයුම්)
**එල්. ජී. හේවාවිතාරණ මහතා**
නියෝජ්‍ය වැඩ කළමනාකරු
**ටී. එම්. ආර්. එන්. තෙන්නකෝන් මහතා**
නියෝජ්‍ය වැඩ කළමනාකරු
**ඩී. එම්. එම්. බී. දිසානායක මහතා**
නියෝජ්‍ය මුදල් කළමනාකරු
**කේ. එච්. තිලකරත්න මහතා**
කළමනාකරු (ලිපි ද්‍රව්‍ය කර්මාන්ත ශාලාව)
**එල්. ටී. ප්‍රේමසිරි මහතා**
ගණකාධිකාරී
**එම්. ආර්. පී. ජයවර්ධන මහතා**
ගණකාධිකාරී
**ඩබ්. එල්. දෙනියගේ මහතා**
අභ්‍යන්තර විගණක
**ඒ. එස්. සී. සිල්වා මහතා**
සහකාර කළමනාකරු (ආරක්ෂක)
**ඩබ්. ඩබ්. එම්. ආරච්චිගේ මහතා**
සහකාර කළමනාකරු වැඩ (ඇස්තමේන්තු)
**කේ. ඩී. ටී. චන්ද්‍රසිරි මහතා**
සහකාර කළමනාකරු වැඩ (සුරක්ෂා)
**එම්. ඒ. කොතලාවල මහතා**
සහකාර කළමනාකරු (ගබඩා)
**එම්. එස්. එල්. කුරුප්පු මහතා**
සහකාර කළමනාකරු වැඩ (ප්‍රොසෙස්)
**එස්. ඩී. කුමාරසිංහ මහතා**
සහකාර කළමනාකරු වැඩ (පොත් බැඳීම්)
**එම්. ඒ. ශාන්ත කුමාර මහතා**
සහකාර කළමනාකරු වැඩ (නඩත්තු)
**කේ. ඒ. ඒ. ඩී. ජුඩ් පීටර් මහතා**
සහකාර කළමනාකරු වැඩ (ලිතෝ)
**පී. කේ. තිලක් මහින්ද මහතා**
සහකාර කළමනාකරු (විකුණුම්)
**එච්. ආර්. ගුණසේකර මහතා**
සහකාර කළමනාකරු
(පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)
**කේ. එච්. බී. සජීව මහතා**
ආයතන කළමනාකරු (කොන්ත්‍රාත්)
**ඩී. එම්. එච්. වයි. දිසානායක මහතා**

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

# 2013

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තියේ කොන්දේසි ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ ක්‍රියාත්මක වූ වැඩ පිළිවෙළ ඇතුළත් සිය 46 වෙනි වාර්තාව රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් මෙසේ ඉදිරිපත් කරයි.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 09 ක් පවත්වන ලදී.

## 01. නිෂ්පාදනය


### 1.1 පාසල් පෙළ පොත්


### 1.1.1 පාසල් පෙළ පොත් මුද්‍රණය

පාසල් පෙළ පොත් මුද්‍රණය මූලික අරමුණ කර ගනිමින් පිහිටුවනු ලැබූ සංස්ථාව විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමගම වෙනත් නිෂ්පාදන අංශ කරා යොමුවී ඇත. ඒ සමගම පාසල් පොත් මුද්‍රණය ඍජුව සංස්ථාව වෙත පැවරීම වෙනුවට ටෙන්ඩර් මගින් තරඟකාරීව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ඇණවුම් ලබා ගැනීමට සංස්ථාවට සිදුවිය. එහෙත් එම ක්‍රමය වෙනස් කරමින් 2013 වර්ෂයේදී ද ටෙන්ඩර් පරිපාටියෙන් පරිබාහිරව පෙළ පොත් මුද්‍රණය සංස්ථාවට පැවරීමට කැබිනට් අනුමැතිය ලැබිණි. ඒ අනුව 2013 වසරේදී ද පාසල් පෙළ පොත් පිටපත් මිලියන 8.5 ක් මුද්‍රණය කර දෙමින් සංස්ථාවට රු. මිලියන 758.3 ක ආදායමක් ලැබුණි.

සමාලෝචිත වර්ෂයේ මුද්‍රණය කළ පාසල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව හා ඉන් ලද ආදායම 2011 හා 2012 ට සාපේක්ෂව පහත දැක්වේ.

| පාසල් මුද්‍රණ වැඩ | 2011 ('000) | 2012 ('000) | 2013 ('000) |
|---|---|---|---|
| පිටපත් සංඛ්‍යාව | 7,611 | 7,905 | 8,546 |
| ආදායම - රු. | 646,480 | 666,223 | 758,335 |





### 1.2 වෙනත් මුද්‍රණ සේවා


සමාලෝචිත වර්ෂය තුළදී දහම් පාසල් පොත් මුද්‍රණය, ආරක්ෂිත මුද්‍රණ සේවා (ලොතරැයිපත්, රිදී රේඛා, බැංකු තැන්පත් සහතික පත්, තැපැල් පාස්පොත්, ලේබල්, එයාපෝර්ට් සුපර් ඩ්‍රෝ යනාදිය) සහ රාජ්‍ය ආයතන සඳහා මුද්‍රණ සේවා සපයන ලදී. එමෙන්ම විවිධ ආයතන සඳහා දිනපොත්, කැලැන්ඩර් යනාදිය මුද්‍රණය කරන ලදී. මීට අමතරව විවිධ ආයතනවල මුද්‍රණ කාර්යයන් ද ඉටු කරන ලදී. විශේෂ මුද්‍රණ සේවා කිහිපයක් පහත පරිදි වේ.

## 1.2.1 සුරක්ෂා මුද්‍රණ සේවා

ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා මහජන සම්පත ලොතරැයිය ද දනට වසර 39 ක පමණ කාලයක් මුද්‍රණය කරන ලදී. මීට අමතරව එයාර්පෝට් ලොතරැයියද මුද්‍රණය කරනු ලැබේ. ලොතරැයි මණ්ඩලයෙන් ලද සියලුම ඇණවුම් මුද්‍රණය කරදුන් අතර 2013 වසරේදී මුද්‍රණය වූ ලොතරැයි ප්‍රමාණය මිලියන 243 කි. ඒ අනුව ආදායම රු. මිලියන 136.1 ක් වී ඇත. ලොතරැයි මුද්‍රණයේ ආදායම හා පිටපත් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

| ලොතරැයි මුද්‍රණ වැඩ | 2011 ('000) | 2012 ('000) | 2013 ('000) |
|---|---|---|---|
| පිටපත් සංඛ්‍යාව | 212,535 | 256,195 | 242,991 |
| ආදායම - රු. | 119,543 | 145,701 | 136,124 |




## 1.2.2 වෙනත් මුද්‍රණ සේවා

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සඳහා මෙන්ම පෞද්ගලික අංශයේ ඇණවුම් ලබා ගැනීම කෙරෙහි විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන ලදී. ඉටු කරන ලද විශේෂ මුද්‍රණ සේවා අතර පහත සඳහන් සේවා ප්‍රධාන තැනක් ගන්නා ලදී.


01. විවිධ ආයතනයන් සඳහා වූ වාර්ෂික වාර්තා
02. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සඳහා වූ විවිධ මුද්‍රණ වැඩ කටයුතු
03. විවිධ ආයතන සඳහා දින පොත් හා දින දර්ශන
04. විශ්ව විද්‍යාල සහතික පත්
05. ජාතික සත්වෝද්‍යානයට අයත් ප්‍රවේශ පත්‍ර හා අනෙකුත් විස්තර පත්‍රිකා
06. සිනමාශාලා ටිකට්පත්
07. සේවක අර්ථසාධක අරමුදලේ විවිධ මුද්‍රණ වැඩ
08. ජාතික ඉතිරි කිරීමේ බැංකුවට අයත් මුද්‍රණ කටයුතු (රිදී රේඛා සහතික පත්)
09. විභාග දෙපාර්තමේන්තුව සඳහා මුද්‍රණය කරන ලද උත්තර ලියන කඩදාසි පොත්


සමාලෝචිත වර්ෂයේදී විවිධ මුද්‍රණ වැඩ ඉටු කරමින් සංස්ථාව ලත් ආදායම රු. මිලියන 799 කි.

## 1.3 අභ්‍යාස පොත් සහ අනෙකුත් පොත් නිෂ්පාදනය


සමාලෝචිත වර්ෂයට සාපේක්ෂව 2011 හා 2012 වසරවල නිෂ්පාදනය පහත පරිදි වේ.

| අභ්‍යාස පොත් හා අනෙකුත් පොත් | 2011 ('000) | 2012 ('000) | 2013 ('000) |
|---|---|---|---|
| පොත් පිටපත් සංඛ්‍යාව | 8,162 | 10,571 | 10,141 |
| වටිනාකම රු. | 193,746 | 234,824 | 228,563 |



අභ්‍යාස පොත් සඳහා අවශ්‍ය ලියන කඩදාසි නියමිත පරිදි නොලැබීම නිසා 2013 වසර සඳහා ලබාදී තිබූ නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.




## 02. අලෙවි හා විකුණුම්

| වර්ෂය | 2011 රු.('000) | 2012 රු.('000) | 2013 රු.('000) |
|---|---|---|---|
| සමස්ත අලෙවිය | 186,856 | 239,075 | 235,593 |

පෙර වර්ෂයේ සමස්ත ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 3,482,140.09 කින් අඩුවී ඇත. පසුගිය වසර කිහිපය තුළ පවත්වාගෙන ආ 20%ට ආසන්න වර්ධන වේගය අඩපණ වී ඇත.

මෙම තත්ත්වයට මූලික වශයෙන් කරුණු 02ක බලපෑම් යොමු වී ඇත.

01. සැපයුම් අමුද්‍රව්‍ය මිල ඉහළ අගයක පැවතීම මත ඇතැම් ප්‍රධාන නිෂ්පාදන වල මිල තරඟකාරී ආයතනවල සමාන නිෂ්පාදන වල මිලට සාපේක්ෂව ඉතා ඉහළ යාම මත බලාපොරොත්තු වූ ඇණවුම් බොහොමයක් නොලැබී යෑම හේතුවෙන් බොහොමයක් අලෙවිසැල් වල ආදායම පසුබෑමකට ලක්විය.

02. ප්‍රධාන අමුද්‍රව්‍ය තොග නොමැති වීම හා සැපයීමේ දී සිදුවූ විශාල ප්‍රමාදයන් නිසා ඇණවුම් සැපිරීමට නොහැකි විය.

## 03. ප්‍රකාශන සේවා

පවතින ප්‍රකාශන තොග අලෙවි කිරීම හරහා සමාලෝචිත වර්ෂය තුළ ආදායම උපදවා ඇති අතර, නව නිෂ්පාදන සිදුකර නැත.

පවතින පැරණි ප්‍රකාශන තොග ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පුස්තකාල සඳහා නොමිලේ බෙදාහැරීමේ ව්‍යාපෘතියක් සකස් කිරීමට කටයුතු සංවිධානය කරමින් පවතී. මේ හරහා ප්‍රකාශන තොගය අඩුකර ගැනීමත් ඉන් අනතුරුව නව ප්‍රකාශන ඉදිරිපත් කිරීමටත් සැලසුම් කර ආදායම් වර්ධනයට පියවර ගැනීමට කටයුතු කෙරේ.

## 04. ස්ථාවර වත්කම්

2013 වර්ෂය අවසානයේදී සංස්ථාව සතු ස්ථාවර වත්කම්වල මුළු පිරිවැය රු. 365,512,555.48 ක් විය. එහි ශුද්ධ වටිනාකම රු. 99,983,204.06 කි. මෙම තත්ත්වය මීට පෙර, එනම් 2012 වසර හා සැසඳීමේදී පිළිවෙළින් රු. 337,870,818.38 ක් හා රු. 93,163,111.02 ක් වශයෙන් විය.

| ස්ථාවර වත්කම් | 2011 ('000) | 2012 ('000) | 2013 ('000) |
|---|---|---|---|
| ආරම්භක වටිනාකම (පිරිවැය) | 301,082 | 322,144 | 337,870 |
| අවසාන වටිනාකම | 322,144 | 337,870 | 365,512 |
| ශුද්ධ වටිනාකම් | 89,097 | 93,163 | 99,983 |


## 05. බදු බැඳියාව

සංස්ථාව තක්සේරු වර්ෂ 2012/ 2013 සඳහා ආදායම් බදු වශයෙන් රු. 51,064,333/- ක මුදලක් සහ ලාභාංශ බදු වශයෙන් රු. 3,595,431/- ක මුදලක් ද සංස්ථාවේ 2013 වසරේ අවසාන ගිණුම් අනුව ප්‍රතිපාදනය කොට ඇත.

| බදු බැඳියාව | 2011 රු. ('000) | 2012 රු. ('000) | 2013 රු. ('000) |
|---|---|---|---|
| ආදායම් බදු | 52,082 | 39,359 | 30,828 |
| ලාභාංශ බදු | 4,606 | 12,899 | 5,454 |
| එකතුව | 56,688 | 52,258 | 36,282 |

## 06. ලාභය


2013 වසර තුළදී සංස්ථාව රු. 132,064,772.54 ක බදු පූර්ව ලාභයක් උපයා ඇති අතර, එය 2012 වසර රු. 140,567,143.44 ක් විය.




| ලාභදායිතාව | 2011 රු. ('000) | 2012 රු. ('000) | 2013 රු. ('000) |
|---|---|---|---|
| බදු පූර්ව ලාභය | 133,688 | 140,567 | 78,095 |
| බදු ප්‍රතිපාදනයෙන් පසු | 77,000 | 88,309 | 41,813 |

## 07. ප්‍රසාද දීමනා

වාර්ෂික ප්‍රසාද දීමනා වශයෙන් සුදුසුකම් ලැබූ සේවකයින් සඳහා මාස 02 ක වැටුපකට සමාන මුදලක් ගෙවන ලදී. එසේ ගෙවන ලද මුළු ප්‍රසාද දීමනාව රු. 35,259,829.28කි. 2012 වසරට සාපේක්ෂව 16% ක වර්ධනයකි.




| ප්‍රසාද දීමනා | 2011 රු. ('000) | 2012 රු. ('000) | 2013 රු. ('000) |
|---|---|---|---|
| රු. | 27,928 | 30,491 | 35,259 |

## 08. සුභ සාධනය

පහත සඳහන් සුභ සාධන සේවා හා පහසුකම් පසුගිය වර්ෂයේ පදනම යටතේ මෙම වසර තුළදී ද පවත්වා ගෙන යන ලදී. මේ වෙනුවෙන් සංස්ථාව වැය කළ මුදල රුපියල් මිලියන 86.6ක් විය.

| | සුභ සාධනය | 2011 රු. ('000) | 2012 රු. ('000) | 2013 රු. ('000) |
|---|---|---|---|---|
| 01. | සේවක ප්‍රවාහන පහසුකම් | 2,093 | 2,545 | 3,064 |
| 02. | සේවක දිරි දීමනා ගෙවීම් | 5,274 | 5,516 | 9,367 |
| 03. | වෛද්‍යාධාර ප්‍රතිලාභ ගෙවීම | 2,854 | 4,567 | 5,541 |
| 04. | සේවක විවිධ සුභ සාධන | 5,556 | 9,424 | 17,845 |
| 05. | කම්කරු වන්දි ආරක්ෂණය | 176 | 191 | - |
| 06. | සියලුම සේවකයින් සඳහා ලිපිද්‍රව්‍ය තෑගි වවුචරයක් ප්‍රදානය කිරීම | 997 | 1,021 | 1,132 |
| 07. | සේවක ප්‍රසාද දීමනා | 27,928 | 30,491 | 35,259 |
| 08. | සේවක නිවාස ණය ප්‍රතිපූරණය | 4,046 | 3,918 | 4,207 |
| 09. | සේවක ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් | 8,570 | 9,170 | 11,319 |
| | එකතුව | 57,494 | 66,843 | 87,734 |

## 09. සේවක මණ්ඩලය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සංස්ථාවේ සේවක සංඛ්‍යාව 708 කි.

| | |
|---|---|
| ප්‍රධාන මුද්‍රණාලය | 367 |
| කාර්යාලය | 104 |
| ලිපිද්‍රව්‍ය කම්හල | 32 |
| ආරක්ෂක අංශය | 49 |
| අලෙවිසල් | 47 |
| සංඝරාජ මාවත අලෙවිසල | 05 |
| අනියම් හා කොන්ත්‍රාත් සේවකයින් | 64 |
| දෛනික වැටුප් ලබන කම්කරුවන් | 22 |
| සංස්ථා ආධුනික සේවකයින් | 18 |

2013 වර්ෂය තුළ දී සේවයෙන් ඉවත් වූ නිලධාරීන්

| නම/තනතුර | දිනය |
|---|---|
| 1. ඒ. ඩී. එන්. එච්. කරුණාපාල මිය<br>සැපයුම් නිලධාරී | 2013. 05. 02 |

## සමාප්තිය

සංස්ථාවේ වැඩ කටයුතු ඉතා සාර්ථක ලෙස කර ගෙන යාම සඳහා ඉතා ලැදිව සහයෝගය දුන් සංස්ථාවේ සියලු සේවකයන්ට සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ. සාර්ථක වැඩ පිළිවෙළක් සඳහා සෑම විටම මග පෙන්වීම කරමින් සහාය ලබාදුන් ගරු පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාටත්, එම වැඩ පිළිවෙළට නිරතුරුව සහයෝගය ලබාදුන් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ.

ඉදිරි වර්ෂය තුළදී ද එවැනිම සහයෝගයක් හා ප්‍රතිචාරයක් සංස්ථාවේ සියලු සේවකයින්ගෙන් පාලනාධිකාරිය බලාපොරොත්තු වන්නේය.

රවීන්ද්‍ර යසලාල් කලන්සූරිය
සභාපති

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
# 2013 දෙසැම්බර් 31 වැනිදා වන විට

## 1. සංස්ථාව පිළිබඳ තොරතුරු

### 1.1 පොදු තොරතුරු

1968 අංක 28 දරන පාර්ලිමේන්තු පනතට අනුව රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව 1968 වසරේදී ස්ථාපනය කෙරිණි. ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය එහි කළමනාකාරීත්වය භාරව ක්‍රියා කරයි. පාදුක්ක පානළුව ප්‍රදේශයේ මෙය පිහිටා තිබේ.

### 1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම්වල ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ පාසල් පෙළපොත් මුද්‍රණය, අභ්‍යාස පොත් නිෂ්පාදනය හා වෙනත් මුද්‍රණ කාර්යයන්.

## 2. සැකසුම සඳහා වන පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් පිළිබඳ පුළුල් ප්‍රකාශනය, අරමුදල් හා මුදල් ගලා ඒමේ වෙනස්කම් සහ ප්‍රතිපත්ති මෙන්ම සටහන් සකසා ඇත්තේ LKAS සහ SLFRS යන ගිණුම්කරණ ප්‍රමිතීන් හා 1971 අංක 38 දරන මූල්‍ය පනතට අනුවය.

### 2.1 ඇගයුම සඳහා වන පදනම

උපචිත පදනම හා අතීත වැය පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශනය සකසා තිබේ.
ශ්‍රී ලංකා රුපියල්වලින් එය ඉදිරිපත් කර ඇත.

### 2.2 අඛණ්ඩ පැවැත්ම

සංස්ථාව පවත්වා ගෙන යාමට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සෙරුවක් සිදු කොට අවධානය යොමු කර ඇත. කෙසේ වෙතත් එය ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා නොකරයි.

# 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### 3.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, කර්මාන්තශාලාව හා උපකරණ එකතු කරන ලද ක්ෂයවීම් පිළිබඳ ශුද්ධ වැය යටතේ සඳහන් කර ඇත.

මුළුමනින්ම ක්‍ෂය වී ඇති එහෙත් තවමත් භාවිත කරන වත්කම්

| වත්කම් වර්ගීකරණය | මුළු වැය (රු.) | මුළුමනින්ම ක්ෂය වී ඇති දේපළවල වටිනාකම (රු) | මුළුමනින්ම ක්ෂය වී ඇති දේපළවල වටිනාකම % ලෙස සමස්ත දේපළවල වටිනාකමින් |
|---|---|---|---|
| ගොඩනැගිලි | 37,182,060 | 6,683,778 | 17 |
| කර්මාන්තශාලා හා උපකරණ | 215,074,630 | 106,079,965 | 49 |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | 4,336,576 | 3,424,420 | 78 |
| රථ වාහන | 46,968,763 | 22,609,313 | 48 |
| යතුරුපැදි | 422,354 | 422,354 | 100 |
| කාර්යාලයීය උපකරණ | 27,988,508 | 10,482,672 | 37 |
| පාපැදි හා අත් කරත්ත | 1,005,978 | 1,005,978 | 100 |
| විද්‍යුත් ප්‍රතිස්ථාපනය | 2,572,950 | 2,572,950 | 100 |
| පරිගණක මෘදුකාංග | 3,394,949 | 1,679,326 | 49 |
| ටිකට්පත් බා කෝඩ් කිරීම සඳහා වන පරිගණක පද්ධතිය | 24,156,081 | 18,744,581 | 77 |

ඉහත වර්ගීකරණය කර ඇති වත්කම් 31.12.2013 දිනට තවදුරටත් භාවිතයට ගත හැකි කාලය තක්සේරු කරමින් පවතින අතර මනා ගිණුම්කරණ සැලැස්මකින් අවශ්‍ය පියවර ගනු ඇත.

#### 3.1.1 ක්‍ෂයවීම්

දේපළ, පිරියත සහ උපකරණවල ජීව ගුණය පිළිබඳ ඍජු තක්සේරුවකින් පසු ක්ෂය වීම් ගණනය කරනු ලැබේ.
තක්සේරු කරන ලද වත්මන් හා සංසන්දනාත්මක ජීව ගුණ වර්ෂ පහත පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 යි |
| කර්මාන්තශාලා හා උපකරණ | වසර 13.33 යි |
| මෝටර් හා වෙනත් වාහන | වසර 4 යි |
| ගෘහභාණ්ඩ හා උපාංග | වසර 10 යි |
| කාර්යාලයීය උපකරණ | වසර 10 යි |
| පරිගණක හා උපාංග | වසර 3 යි |
| කර්මාන්ත උපාංග | වසර 4 යි |

### 3.2 තොරතුරු ඇතුළත් භාණ්ඩ ලේඛනය

තොරතුරු ඇතුළත් භාණ්ඩ ලේඛන සඳහා වටිනාකම් අවම වැය හා යළි උපයාගත හැකි දළ අගය මත පදනම්ව ලබා දී ඇත.

### 3.3 බදුකරණය

බැඳුම්කරණ ක්‍රමවේදය හා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතට අනුව සිදු කර ඇත.

### 3.4 මුදල් හා මුදල් සමතුල්‍යභාවය

# 4. මූල්‍ය උපාංග - මූලික හඳුනාගැනීම් හා ඉදිරි පියවර

## 4.1 මූල්‍ය වත්කම්

### 4.1.1 මූල්‍ය වත්කම් අපහායනය

වෙළඳ ලැබීම් 2.5 මත ලබා දී ඇත.

## 4.2 මූල්‍ය බැඳුම්කර

සංස්ථා මූල්‍යකරණයේ මාධ්‍ය මහජන බැංකුවෙන් ලබා ගත් ණය පැකේජයකි. ඉඩම්, ගොඩනැගිලි හා ස්ථාවර යන්ත්‍රෝපකරණ පදනම මත එය ලබා ගෙන ඇත.
පසුගිය කාලයේ සේවක භාරකාර අරමුදලේ අඩි අය සඳහා බැඳුම්කරයක් ඇත.

### 4.2.1 ස්ථිරව නොපවතින බැඳුම්කර

කම්කරු අධිකරණය හමුවේ පවතින අභියාචනා 07ක් හේතුවෙන් ස්ථිරව නොපවතින බැඳුම්කර පවතී. දිස්ත්‍රික් අධිකරණ වෙත පැමිණිලි 03ක් ද අභියාචනාධිකරණය වෙත පැමිණිල්ලක් ද ඉදිරිපත්වී ඇත.

# 5. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

1983 අංක 12 දරන අර්ථසාධක පනත යටතේ අර්ථසාධක ගෙවීමට සංස්ථාව බැඳී සිටී. අර්ථසාධක ගෙවීම කිසිදු හිඟයකින් තොරව සිදු කෙරිණ. 2013.12.31 දිනට අනුව ඇති ප්‍රතිපාදනවලට අනුව වෙනත් අරමුදලක් ස්ථාපනය නොකෙරිණ.

# 6. ආදායම් හා වියදම්

## 6.1 ආදායම් හඳුනාගැනීම

උපචිත පදනම මත සියලු ආදායම් හඳුනා ගැනේ.

පොලී මගින් ආදායම

සංස්ථා සේවකයන්ට ලබා දෙන ණය සඳහා 10% ක පොලියක් අය කරනු ලැබේ.

## 6.2 වියදම්

වසරේ ලාභය ගණනය කිරීමේදී ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා දැරූ වියදම් සියල්ල ආදායම්වලින් අඩු කර ගෙන තිබේ.

## 6.3 ණයට ඉල්ලා ගැනීම සඳහා වන වැය

ණයට ඉල්ලා ගැනීම් සිදු වූ කාලය තුළ ඒවා වැය ලෙස හඳුනා ගැනේ.

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# 2013 දෙසැම්බර් 31 වන විට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන

| | සටහන | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 14 | 99,983,204 | 93,163,111 |
| | | **99,983,204** | **93,163,111** |
| ජංගම වත්කම් | | | |
| තොගය | 15 | 307,846,607 | 346,038,206 |
| වෙළඳ ලැබීම් | 16 | 733,280,245 | 476,781,757 |
| වෙනත් ලැබීම් | 17 | 143,145,763 | 101,718,337 |
| පූර්ව ගෙවීම් | | 92,221 | 749,915 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 18 | 4,659,788 | 6,588,506 |
| | | 1,189,024,624 | 931,876,721 |
| මුළු වත්කම් | | **1,289,007,828** | **1,025,039,832** |
| ස්කන්ධය හා බැරකම් | | | |
| ප්‍රාග්ධන නිකුතුව | | 15,000,000 | 15,000,000 |
| සංචිත | | 15,003,633 | 15,003,633 |
| රඳවා ගත් ඉපයීම් | | 283,100,175 | 337,811,585 |
| මුළු ස්කන්ධය | | **313,103,808** | **367,815,218** |
| ජංගම නොවන බැරකම් | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | | 129,410,948 | 110,400,404 |
| දිගු කාලීන ණය සඳහා පොළී | | 6,167,715 | 12,200,004 |
| | | **135,578,663** | **122,600,408** |
| ජංගම බැරකම් | | | |
| වෙළඳ ගෙවීම් | 19 | 310,892,870 | 106,176,731 |
| වෙනත් ගෙවීම් | 20 | 45,041,289 | 92,094,629 |
| කෙටි කාලීන ණය සඳහා පොළී | | 437,919,685 | 296,586,575 |
| බැංකු අයිරා | | 46,471,513 | 39,766,271 |
| මුළු බැරකම් | | **840,325,357** | **534,624,206** |
| මුළු ස්කන්ධය හා බැරකම් | | **1,289,007,828** | **1,025,039,832** |

සංස්ථාවේ මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මූල්‍ය පනතේ අවශ්‍යතාවන්ට අනුකූල බව සහතික කරමු.

එන්. ඩී. ප්‍රියංකර කුමාර
මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා තිබේ. පිටු අංක 15, 16 සහ 17 හි ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 19, 20 මෙන්ම 24 සිට 26 දක්වා ඇතුළත් අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත්ම අංග වේ.

පී. ජී. දසනායක
සභාපති/අධ්‍යක්ෂ

එච්. කේ. ඩී. එල්. ගාමිණී
උප සභාපති/අධ්‍යක්ෂ

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| 15. තොගය | | |
| අමුද්‍රව්‍ය | 158,194,164 | 190,516,533 |
| පාරිභෝගික භාණ්ඩ | 5,767,154 | 5,017,022 |
| අමතර කොටස් | 50,815,440 | 50,050,009 |
| දෘඩාංග | 717,350 | 1,459,621 |
| නිමි තොගය | 74,557,352 | 79,014,565 |
| නොනිමි තොගය | 17,795,146 | 19,980,456 |
| | **307,846,606** | **346,038,206** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| 16. වෙළඳ ලැබීම් | | |
| වෙළඳ ණය ගැතියෝ | 750,607,688 | 514,427,534 |
| බොල් ණය සඳහා වෙන් කිරීම් | (18,765,192) | (38,582,065) |
| වෙනත් ණයගැතියෝ | 1,437,749 | 936,287 |
| | **733,280,245** | **476,781,756** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| 17. වෙනත් ලැබීම් | | |
| සේවක ණය හා අත්තිකාරම් (සටහන 17.1) | 24,803,473 | 17,011,320 |
| තැන්පතු හා ලැබීම් (සටහන 17.2) | 6,066,344 | 6,122,447 |
| විකුණුම් පාලන ගිණුම | (2,288,897) | - |
| බැංකු ණය | 114,564,843 | 78,584,571 |
| | **143,145,763** | **101,718,338** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| 17.1 සේවක ණය හා අත්තිකාරම් | | |
| ණය හිමියාගේ අත්තිකාරම් ගිණුමට | 1,680,649 | - |
| ආපදා ණය | 20,979,465 | 15,676,776 |
| උත්සව අත්තිකාරම් | 2,132,913 | 1,280,413 |
| සේවක වැටුප් අත්තිකාරම් | 10,445 | 54,130 |
| | **24,803,472** | **17,011,319** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| 17.2 තැන්පතු හා ලැබීම් | | |
| තැන්පතු සඳහා ලැබීම් | 5,546,088 | 5,676,697 |
| අමතර වෙනත් ලැබීම් | 520,256 | 445,750 |
| | **6,066,344** | **6,122,447** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| 18. මුදල් හා මුදල් වලට සමාන දෑ | | |
| බැංකුවේ ඇති මුදල් | 1,463,800.50 | 2,984,267.00 |
| මාර්ගස්ථ මුදල් | 3,090,537.43 | 3,379,472.00 |
| අතැති මුදල් | 105,450.00 | 224,767.00 |
| | **4,659,787.93** | **6,588,506.00** |

මුදල් ගලා ඒම, මුදල් සහ මුදල් හා සමාන ප්‍රකාශනය සඳහා වන තොරතුරු පහත පරිදි වේ.

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| බැංකුවේ ඇති මුදල් | 1,463,800.50 | 2,984,267.00 |
| මාර්ගස්ථ මුදල් | 3,090,537.43 | 3,379,472.00 |
| අතැති මුදල් | 105,450.00 | 224,767.00 |
| | 4,659,787.93 | 6,588,506.00 |
| බැංකු අයිරා | (46,471,513.00) | (39,766,271.00) |
| | **(41,811,725.07)** | **(33,177,765.00)** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| 19. වෙළඳ ගෙවීම් | | |
| වෙළඳ ණය හිමියන් | 54,174,102.00 | 50,483,171.00 |
| ණය හිමි අත්තිකාරම් | - | 2,297,182.00 |
| වෙනත් ණය හිමියන් | 74,259,098.00 | 1,086,100.00 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 181,144,726.00 | 52,257,668.00 |
| විකුණුම් අත්තිකාරම් | 1,314,944.00 | 52,610.00 |
| | **310,892,870.00** | **106,176,731.00** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| 20. වෙනත් ගෙවීම් | | |
| උපචිත වියදම් | 42,566,766.00 | 90,358,769.00 |
| තැන්පතු ගෙවීම් | 2,474,523.00 | 1,735,861.00 |
| | **45,041,289.00** | **92,094,630.00** |

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා
# මුදල් ගලාඒම පිළිබඳ වාර්තාව

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය<br>බදු පෙර ලාභය | 78,095,872 | 140,567,143 |
| ගැළපීම් | | |
| ස්ථාවර වත්කම් ක්ෂය | 18,715,828 | 13,828,329 |
| පෙර වර්ෂයේ ගැළපීම් | (94,418,994) | 21,807,219 |
| මූල්‍ය වියදම් | 62,548,766 | 57,359,447 |
| පාරිතෝෂික සඳහා වසර තුළ වෙන්කළ ප්‍රතිපාදන | 21,754,712 | 17,038,160 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය | **86,696,184** | **250,600,298** |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම | | |
| තොගය (වැඩි)/අඩුවීම | 38,191,599 | (51,919,058) |
| (වැඩිවීම්)/ වෙළඳ හා වෙනත් ලැබීම් අඩුවීම | (256,498,488) | (12,841,089) |
| (වැඩිවීම්)/ වෙනත් ලැබීම්වල අඩුවීම | (40,769,732) | (14,840,093) |
| ජංගම බැරකම්වල වැඩි/(අඩුවීම) | 28,775,740 | 37,252,663 |
| මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය | **(143,604,697)** | **208,252,721** |
| ගෙවූ බදු | 92,604,587 | (66,456,627) |
| සේවක විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම් | (2,744,168) | (3,384,175) |
| මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය | **(53,744,278)** | **138,411,919** |
| ආයෝජන කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය<br>දේපළ, පිරියත, උපකරණ මිලදී ගැනීම | (27,641,737) | (17,894,164) |
| ආයෝජන කටයුතුවලින් දළ මුදල් ගලාඒම | **(27,641,737)** | **(17,894,164)** |
| මූල්‍ය කටයුතුවලින් මුදල් ගලාඒම | | |
| ණයට ගැනුම් සඳහා ගෙවීම | 135,300,821 | (57,402,104) |
| පොළී ගෙවීම | (62,548,766) | (57,359,447) |
| මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ගලාඒම | **72,752,055** | **(114,761,551)** |
| ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්) මුදල් හා මුදල් හා සමාන වත්කම් | **(8,633,959)** | **5,756,203** |
| කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන වත්කම් ප්‍රමාණය | **(33,177,766)** | **(38,933,969)** |
| කාලසීමාව අවසානයේ මුදල් හා මුදල් හා සමාන වත්කම් ප්‍රමාණය (සටහන 18) | **(41,811,725)** | **(33,177,766)** |

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා
# සම කොටස්වල වෙනස්වීම පිළිබඳ වාර්තාව

| | ප්‍රාග්ධන නිකුතුව | ප්‍රාග්ධන සංචිතය | පොදු සංචිතය | සංවර්ධන සංචිතය | රඳවාගත් ඉපැයීම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2012. 01. 01 වැනි දිනට ශේෂය | **1,500,000** | **102,491** | **1,000,000** | **13,901,142** | **227,694,891** | **257,698,524** |
| ලාභය/ (පාඩුව) වසර සඳහා | - | - | - | - | 88,309,474 | 88,309,474 |
| පෙර වර්ෂයේ ගැළපීම | - | - | - | - | 21,807,219 | 21,807,219 |
| 2012.12.31 දිනට ශේෂය | **1,500,000** | **102,491** | **1,000,000** | **13,901,142** | **337,811,584** | **367,815,217** |
| 2013. 01. 01 දිනට ශේෂය | 15,000,000 | 102,491 | 1,000,000 | 13,901,142 | 337,811,584 | 367,815,217 |
| ලාභය/ (පාඩුව) වසර සඳහා | | | | | 41,813,401 | 41,813,401 |
| පූර්ව වසර සඳහා සැකසුම් | | | | | (96,524,810) | (96,524,810) |
| 2013. 12. 31 දිනට ශේෂය | **15,000,000** | **102,491** | **1,000,000** | **13,901,142** | **283,100,175** | **313,103,808** |

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා
## ආදායම් පිළිබඳ පුළුල් වාර්තාව

| | සටහන් | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| ආදායම | 7 | 1,236,901,899 | 1,209,672,252 |
| විකුණුම් පිරිවැය | | (801,809,829) | (754,495,129) |
| දළ ලාභය | | 435,092,070 | 455,177,123 |
| වෙනත් මෙහෙයුම්වලින් ආදායම | **8** | 6,891,679 | 15,162,617 |
| බෙදාහැරීමේ වියදම් | **9** | (35,755,152) | (52,258,941) |
| පරිපාලන වියදම් | **10** | (185,818,553) | (160,482,196) |
| වෙනත් මෙහෙයුම් සඳහා වියදම් | **11** | (81,262,847) | (60,306,868) |
| මෙහෙයුම් ලාභය | | 139,147,197 | 197,291,735 |
| මූල්‍ය ආදායම | | 1,497,441 | 634,855 |
| මූල්‍ය වියදම් | **12** | (62,548,766) | 57,359,447 |
| බදු පෙර ලාභය | | 78,095,872 | 140,567,143 |
| ආදායම් බදු | **13** | (36,282,471) | (52,257,669) |
| බදු පසු ලාභය | | **41,813,401** | **88,309,474** |

## 2013 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා
## ආදායම් පිළිබඳ පුළුල් වාර්තාව

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| වාර්ෂික ලාභය | 41,813,401 | 88,309,474 |
| වෙනත් විස්තීරණ ආදායම | - | - |
| වර්ෂය තුල මුළු විස්තීරණ ආදායම | 41,813,401 | 88,309,474 |

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# 2013 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

| | | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 07. | ආදායම් | | |
| | ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවෙන් ලද ආදායම | 211,757,807 | 214,021,480 |
| | ප්‍රධාන මුද්‍රණාලයෙන් ලද ආදායම | | |
| | පෙළපොත් | 756,660,138 | 711,472,700 |
| | වැඩ පැවරුම් | 244,648,596 | 259,124,246 |
| | ප්‍රකාශන | 168,676 | 306,972 |
| | වෙනත් අලෙවි කටයුතුවලින් ලද ආදායම | 23,666,684 | 24,746,855 |
| | | **1,236,901,901** | **1,209,672,253** |
| 08. | වෙනත් මෙහෙයුම්වලින් ලද ආදායම | | |
| | විවිධ ආදායම් | 6,514,943 | 14,712,574 |
| | ටෙන්ඩර් තැන්පතු | 376,735 | 450,043 |
| | | **6,891,678** | **15,162,617** |
| 09. | බෙදාහැරීම් වියදම් | | |
| | ආර්ථික සේවා ගාස්තු | 3,127,786 | - |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | 16,488,493 | 18,454,806 |
| | මෝටර් රථවාහන නඩත්තුව | 4,320,709 | 4,387,882 |
| | බොල් ණය සඳහා ප්‍රතිපාදන | 5,131,721 | 24,947,525 |
| | දැන්වීම් සඳහා | 5,673,521 | 1,491,272 |
| | අලෙවි ප්‍රවර්ධන කටයුතු | 970,861 | 2,858,151 |
| | වෙළඳසැළ නඩත්තු කිරීමට | 42,061 | 14,700 |
| | විකුණුම් කොමිස් | - | 104,606 |
| | | **35,755,152** | **52,258,942** |
| 10. | පරිපාලන වියදම් | | |
| | කුලී | 2,832,598 | 2,863,379 |
| | ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු | 2,772,075 | 2,446,179 |
| | විදුලිය | 249,831 | 163,314 |
| | කාර්යාල උපකරණ නඩත්තුව | 259,879 | 452,770 |
| | ක්ෂයවීම් - කාර්යාලීය උපකරණ | 1,581,317 | 1,211,862 |
| | - ගෘහභාණ්ඩ හා උපාංග | 89,854 | 73,124 |
| | - පරිගණක මෘදුකාංග | 680,766 | 424,249 |
| | - යතුරුපැදි | | |
| | වරිපනම් | 212,963 | 183,822 |
| | ජලය | 40,066 | 27,767 |
| | වැටුප් හා වේතන | 96,758,524 | 83,529,355 |
| | අතිකාල දීමනා | 9,320,660 | 7,547,170 |
| | සේවක අර්ථසාධක අරමුදල | 12,622,832 | 10,504,416 |
| | සේවක භාරකාර අරමුදල | 3,157,175 | 2,623,883 |
| | දිරි දීමනා | 2,569,050 | 2,357,500 |
| | සභාපති වේතනය | 720,000 | 720,000 |
| | උප සභාපති වේතනය | 135,000 | 135,000 |
| | මාණ්ඩලික අධ්‍යක්ෂ ගාස්තු | 213,600 | 360,000 |
| | තැපැල් ගාස්තු | 199,893 | 168,179 |
| | දුරකථන | 1,378,238 | 1,791,285 |
| | පුවත්පත් දැන්වීම් හා ප්‍රකාශන | 147,900 | 410,780 |

| | | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | ප්‍රවාහනය | 1,097,565 | 854,803 |
| | පුවත්පත් හා වාර සඟරා | 77,630 | 70,680 |
| | විදේශ සංචාර / සේවක පුහුණුවීම් (විදේශ) | 2,101,090 | 2,732,090 |
| | අන්තර්ජාල / විද්‍යුත් තැපැල | 283,916 | 480,729 |
| | මුද්‍රණ හා ලේඛන | 2,650,336 | 6,548,550 |
| | විගණන වියදම් | 1,000,000 | 510,116 |
| | වින්දනාත්මක කටයුතු | 868,443 | 347,819 |
| | නෛතික හා උපදේශන සේවා | 1,289,002 | 583,736 |
| | 25 මෝටර් රථවාහන නඩත්තුව | 4,320,709 | 4,387,882 |
| | පොදු කාර්යාලීය වියදම් | 1,640,747 | 1,738,177 |
| | විවිධ වියදම් | 816,940 | 573,205 |
| | පාරිතෝෂික වියදම් | 21,754,712 | 17,038,160 |
| | ටෙන්ඩර් මණ්ඩල තාක්ෂණික කමිටු වියදම් | 575,625 | 530,975 |
| | මුදල් පරිවාර වියදම් | 73,904 | 186,962 |
| | සාමාජික ගාස්තු | 22,500 | 13,700 |
| | සේවක පුහුණුකිරීම් | 240,640 | 483,030 |
| | නවාතැන් පහසුකම් | 1,117,483 | 424,001 |
| | අධ්‍යක්ෂ මණ්ඩල හමු සඳහා වියදම් | 540,231 | 118,730 |
| | ආධාර | 7,761,599 | 2,765,943 |
| | මෝටර් රථවාහන කුලී | 1,232,414 | 1,381,200 |
| | අලෙවි විශ්ලේෂණ ගාස්තු | 277,910 | 335,206 |
| | මුදල් ප්‍රවාහන ගාස්තු | 75,606 | 123,868 |
| | පරිගණක කාර්යංශ සේවා ගාස්තු | 57,331 | 258,600 |
| | | **185,818,554** | **160,482,196** |
| 11. | වෙනත් මෙහෙයුම් විදයම් | 17,845,411 | 9,424,218 |
| | සේවක සුහසාධනය | 5,541,863 | 4,567,495 |
| | සේවක වෛද්‍ය පහසුකම් | 4,207,441 | 3,917,959 |
| | නිවාස ණය පොලී | 35,259,829 | 30,491,383 |
| | කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා | 3,495,000 | - |
| | විශේෂ දිරි දීමනා | 3,064,447 | 2,545,206 |
| | කාර්ය මණ්ඩල ප්‍රවාහනය | 11,319,121 | 9,170,234 |
| | නිවාඩු සඳහා ගෙවීම් | 529,736 | 190,371 |
| | උපයන විට ගෙවීම් බදු | **81,262,848** | **60,306,866** |
| 12. | මූල්‍ය වියදම් | | |
| | බැංකු ගාස්තු | 8,214,558 | 7,374,238 |
| | බැංකු අයිරා පොලී | 6,301,167 | 6,276,304 |
| | බැංකු ණය පොලී - කෙටි කාලීන | 46,531,402 | 41,085,847 |
| | බැංකු ණය පොලී - දිගු කාලීන | 1,501,638 | 2,617,458 |
| | දඩ ගාස්තු | - | 5,600 |
| | | **62,548,765** | **57,359,447** |
| 13. | ආදායම් බදු | | |
| | වසර සඳහා ආදායම් බදු ප්‍රතිපාදන | 30,828,194 | 39,358,800 |
| | ලාභාංශ බදු සඳහා ප්‍රතිපාදන | 5,454,277 | 12,898,869 |
| | | **36,282,471** | **52,257,669** |

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
## 2013 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

14. දේපළ කර්මාන්තශාලා සහ උපකරණ

| විස්තරය | 2012.01.01.දිනට | වසර තුළ මිලදී ගැනීම් හා ප්‍රත්‍යාගණය | වර්ෂය තුළදී ඉවත් කිරීම් | 2012.12.31. දිනට ශේෂය | ආරම්භක ශේෂයේ වෙනස | වසර සඳහා අමතර හා ප්‍රතිප්‍රමාණ වියදම් | වර්ෂය තුළදී ඉවත් කිරීම් | 2013. 12. 31 දිනට |
|---|---|---|---|---|---|---|---|---|
| **වියදම්** | | | | | | | | |
| ඉඩම් | 475,126 | - | - | 475,126 | - | - | - | 475,126 |
| ගොඩනැගිලි | 37,182,060 | - | - | 37,182,060 | - | - | - | 37,182,060 |
| කර්මාන්තශාලා හා උපකරණ | 209,002,357 | 211,240 | - | 209,213,597 | - | 5,861,034 | - | 215,074,631 |
| ගෘහ උපකරණ හා උපාංග | 4,177,008 | 138,468 | - | 4,315,476 | - | 21,100 | - | 4,336,576 |
| කාර්යාලීය උපකරණ | 18,482,275 | 4,284,667 | (33,870) | 22,733,072 | - | 5,255,437 | - | 27,988,509 |
| කර්මාන්ත උපාංග හා වර්ග | 1,785,681 | 18,800 | - | 1,804,481 | - | 130,095 | - | 1,934,576 |
| ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන | 2,572,951 | - | - | 2,572,951 | - | - | - | 2,572,951 |
| මෝටර් හා වෙනත් වාහන | 24,037,646 | 10,751,989 | (2,133,611) | 32,656,025 | - | 15,741,071 | - | 48,397,096 |
| පරිගණක හා උපාංග | 24,429,031 | 2,489,000 | - | 26,918,031 | - | 633,000 | - | 27,551,031 |
| එකතුව | **322,144,135** | **17,894,164** | **(2,167,481)** | **337,870,819** | **-** | **27,641,737** | **-** | **365,512,556** |
| **උපචිත ක්ෂයවීම්** | | | | | | | | |
| ගොඩනැගිලි | 25,919,143 | 797,309 | - | 26,716,453 | (34,852) | 762,457 | - | 27,444,057 |
| කර්මාන්තශාලා හා උපකරණ | 143,414,254 | 7,547,630 | - | 150,961,884 | 123,964 | 8,549,986 | - | 159,635,834 |
| ගෘහ උපකරණ හා උපාංග | 3,651,552 | 73,124 | - | 3,724,676 | (73,402) | 89,854 | - | 3,741,128 |
| කාර්යාලීය උපකරණ | 12,682,924 | 1,211,862 | (33,870) | 13,860,915 | (79,119) | 1,581,317 | - | 15,363,113 |
| කර්මාන්ත උපාංග හා වර්ග | 1,353,329 | 122,260 | - | 1,475,589 | - | 97,566 | - | 1,573,155 |
| ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන | 2,572,950 | - | - | 2,572,950 | - | - | - | 2,572,950 |
| මෝටර් හා වෙනත් වාහන | 22,892,586 | 2,149,585 | (2,133,611) | 22,908,560 | 1,811,587 | 5,193,641 | - | 29,913,788 |
| පරිගණක හා උපාංග | 20,562,122 | 1,926,559 | - | 22,486,680 | 357,638 | 2,441,008 | - | 25,285,326 |
| එකතුව | **233,048,860** | **13,828,329** | **(2,167,481)** | **244,707,707** | **2,105,816** | **18,715,829** | **-** | **265,529,351** |
| ලේඛනගත කළ අගය | **89,095,275** | **4,065,835** | **-** | **93,163,112** | **(2,105,816)** | **8,925,908** | **-** | **99,983,205** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීඑම්/ජී/එස්පීසී/1/ 13/42

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 මාර්තු ५ දින

සභාපති,

රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව

**රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2014 මැයි 09 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. අවාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.ගි.ප්‍ර.)

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 02

අවසන් තොගවල වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. ශුද්ධ උපලබ්දි අගයට තොගවල අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, තොගවල අගය ශුද්ධ උපලබ්ධි අගය දක්වා ලියා අඩුකළ ආකාරය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 07

------------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් බදු ලෙස රු.31,421,285 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි තථ්‍ය ආදායම් බදු ගෙවීම් ප්‍රමාණය දක්වනු වෙනුවට, රු.92,604,587 ක් ආදායම් බදු ප්‍රතිපූර්ණය කිරීමක් ලෙස දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 08

------------------------

පෙර වර්ෂවලට අදාළ වැරදි නිවැරදි කිරීමක් ලෙස ණයගැතියන්, ණයහිමියන් සහ වෙනත් වගකීම් ගිණුම්වල ශේෂයන් අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්ත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීමක් සිදු කිරීම වෙනුවට සම්පූර්ණ මුදලම ඉකුත් වර්ෂයේ ඉදිරියට ගෙන ආ සමුච්චිත ලාභයට ගලපා තිබුණි.

(ඉ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 16

------------------------

පිරිවැය රු. 158,465,019 ක්වූ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු තවදුරටත් භාවිතයට ගනු ලබන වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඊ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 23

------------------------

ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම පිළිබඳ සළකා බලා ඒ අනුව කටයුතු කිරීමට අස්ථිත්වයන් උනන්දු කර තිබුණද සංස්ථාව විසින් ප්‍රාග්ධනිත කළ හැකි ණය ගැනුම් පිරිවැය හඳුනානොගෙන සුදුසුකම් ලත් වත්කම්වලට අදාල ණය ගැනුම් පිරිවැය පුනරාවර්තන වියදමක් ලෙස ආදායමට ලියා හැර තිබුණි.

(උ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 39

-----------------------

සංස්ථාවේ මූල්‍ය වත්කම් සාධාරණ අගයට (Fair Value) අගය කිරීමකින් තොරව එහි පිරිවැයට අගය කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

ණය අයකර ගැනීමේ හැකියාව පිළිබඳ විධිමත් පරිදි විශ්ලේෂණයක් සිදුකර බොල් හා අඩමාණ ණය ලෙස කපාහැරිය යුතු ප්‍රමාණය නිශ්චය නොකර, මුළු වෙළඳ ණයගැතියන්ගෙන් සියයට 2.5 ක් එනම් රු.18,765,192 ක් සමාලෝචිත වර්ෂයේ බොල් හා අඩමාණ ණය ලෙස වෙන්කර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

---

2012 වර්ෂයට අදාල ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීමේදී ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු බදු වටිනාකම පමණක් බදු බැරක් ලෙස හිලව් කිරීමට ඉඩ දෙන නමුත්, 2012 වර්ෂය සඳහා ලාභය මත ගෙවිය යුතු අදායම් බදු ගණනය කිරීමේදී වර්ෂය තුළ නොගෙවූ ආර්ථික සේවා ගාස්තු වටිනාකම ගෙවිය යුතු බද්දෙන් අඩුකර තිබීම හේතුවෙන් ගෙවිය යුතු ආදායම් බදු ලෙස ඉදිරියට ගෙන ආ ශේෂය රු.2,232,569 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.4 නොසැසඳු පාලන ගිණුම්

---

විකුණුම් රැස්කිරීමේ ගිණුමේ රු.2,288,897 ක් වූ බැර ශේෂය විකුණුම් පාලන ගිණුම හා සැසඳීම් කර නොතිබුණි.

### 2.2.5 පැහැදිලි නොකරන ලද වෙනස්කම්

---

පහත සඳහන් වෙනස්කම් විගණනයේදී පැහැදිලි කර නොතිබුණි.

(අ) ණය හිමි අත්තිකාරම් ගිණුම හා උපලේඛනය අතර රු.460,550 ක වෙනස

(ආ) 2008 හා ඊට පෙර වර්ෂයන් සඳහා පාසල් පොත් ඇණවුම් සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ණයගැති ශේෂය සහ එම දෙපාර්තමේන්තුව සනාථ කරන ලද ණයගැති ශේෂය අතර රු. 8,535,013 ක වෙනස

(ඇ) ගම්පහ අලෙවිසැලේ 2/ඩී/3146 දරන ණයගැති ශේෂය සහ අලෙවිසැලේ සනාථ කරන ලද ණයගැති ශේෂය අතර රු. 493,662 වෙනස

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

වෙළඳ ණයගැතියන්ගෙන් අයවිය යුතු රු.231,103,473 ක් වූ අදාළ ශේෂ තහවුරු කිරීම් ලිපි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී වෙළඳ ණයගැති ශේෂය රු. 514,427,534 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු. 750,607,688 ක් වී තිබුණි. වෙළඳ ණයගැති ශේෂය සියයට 46 ක ප්‍රතිශතයකින් වර්ධනය වී තිබුණි. සභාපතිවරයාගේ අදහස් දැක්වීමට අනුව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් මුදල් ලැබීම ප්‍රමාද වීම මෙම ණයගැති ශේෂ වර්ධනය වීමට හේතු වී තිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු වෙළඳ ණයගැති ශේෂය වූ රු.750,607,688 ක මුදලින් රු. 69,480,869 ක් වර්ෂ 01 ක කාලයක සිටද, රු.48,529,734 ක් වර්ෂ 2 – 5 ක් අතර කාලයක සිටද අය නොවී පැවති අතර වර්ෂ 05 ඉක්ම වූ ණයගැති ශේෂය රු. 27,607,294 ක් විය. ඉකුත් වර්ෂ කිහිපයකට සාපේක්ෂව සලකා බැලීමේ දී සමාලෝචිත වර්ෂය තුළදී ණය අයකර ගැනීම ඉතාම දුර්වල මට්ටමක පැවතුණි. අලෙවිසැල්වල ණය අයවීම් සියයට 93 - 28 දක්වා පරාසයක පැවති අතර මහනුවර සහ ගම්පහ අලෙවිසැල්වල ණය අයවීම ඉතාම අවම මට්ටමක පැවතුණි.

(ඇ) ණයගැති ශේෂ සනාථකිරීම් ලබාදී තිබුණු ණයගැතියන්ගෙන් වටිනාකම රු.928,947 ක් වූ ණයගැතියන්ගෙන් කිසිදු මුදල් ශේෂයක් සංස්ථාවට ගෙවීමට නොමැති බව දක්වා තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් තවදුරටත් අවධානය යොමු කර නොතිබුණි.

(ඈ) ජාතික අධ්‍යාපන ආයතනය මගින් අයවිය යුතු වසර 04 කට වඩා පැරණි රු.6,448,439 ක ණය ශේෂයෙන් 2014 නොවැම්බර් අවසානය දක්වා කිසිදු මුදලක් අය වී නොතිබුණි.

(ඉ) ජාතික කඩදාසි සංස්ථාවෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.7,989,969 ක ණය ශේෂයක් අයවිය යුතුව තිබුණද ඉන් රු.6,689,495 ක වටිනාකමක් වර්ෂ 02 කටත් වැඩිකාලයක සිට අයනොවී පැවතුණි.

(ඊ) අනුරාධපුර අලෙවිසැලෙහි 2012 වර්ෂයේ සිට අයකර ගතයුතු රු.5,491,257 ක ණයගැති ශේෂය 2014 නොවැම්බර් 30 දින දක්වාම පියවා නොතිබුණි. මෙම ණය, ණය ලබාදීමේ පරිපාටියෙන් බැහැරව හිටපු සභාපතිවරයාගේ වාචික උපදෙස් මත ලබා දී තිබුණ අතර ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කර තිබුණද, මෙම ණය අයකර ගැනීම සම්බන්ධන්ව නීතිමය පියවර ගෙන නොතිබුණි.

(උ) සංස්ථාවේ අභ්‍යාස පොත් අලෙවි කිරීම සඳහා 2010 වර්ෂයේ සිට අලෙවි නියෝජිතයෙකු පත්කර තිබුණු අතර මෙම නියෝජිතයා ගෙවීම පැහැර හැර තිබුණු මුදල රු. 5,800,306 ක් විය. මෙම ණය ලබාදීම සම්බන්ධව නියෝජිතයාගෙන් ඇපකර ලබාගෙන නොතිබූ අතර සභාපති වරයාගේ නියෝග පරිදි ණය ලබාදී තිබුණි. ඇපකර රහිතව ණය පදනම මත අභ්‍යාස පොත් අලෙවිකිරීමේදී අත්පිට මුදලට භාණ්ඩ විකිණීමේදී ලබාදෙන සියයට 40 ක වට්ටමද ලබාදී තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මුළු ණය හිමි වටිනාකම වූ 54,174,102 ක් වූ අතර ණය හිමි කාල විශ්ලේෂණයට අනුව වසර 2ත් වසර 5 ත් අතර බේරුම් නොකරන ලද ණය හිමියන්ගේ වටිනාකම රු. 23,102,304 ක් විය. මෙය මුළු ණය හිමියන්ගේ වටිනාකමෙන් සියයට 42 ක් වී තිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 26 (1) උපවගන්තිය | 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා, ගනුදෙනුකරුවන්ගෙන් එකතු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළයුතු එකතු කළ අගය මත බදු රු.116,696,970 ක වටිනාකමින් රු.92,960,966 ක් එනම් සියයට 70 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 4 වන වගන්තිය | 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ගනුදෙනුකරුවන්ගෙන් එකතු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙත ප්‍රේෂණය කළයුතු ජාතිය ගොඩනැගීමේ බදු රු.73,845,234 ක වටිනාකමකින් රු.67,718,361 ක් එනම් සියයට 90 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 (2)(ඇ) රෙගුලාසිය | සභාපතිවරයාගේ නිල රථයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම් සඳහා සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබුණු රු.1,050,000 ක් වූ අත්තිකාරම් මුදල විගණන දිනය වූ 2014 දෙසැම්බර් 31 දින දක්වා පියවා නොතිබුණි. |
| (ඇ) 2003 ඔක්තෝබර් 28 දිනැති අංක 17 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සංස්ථා සභාපතිවරයා විදේශ ගතවන විට රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබා නොතිබුණු අතර එම විදේශ ගමන් සඳහා සංස්ථා අරමුදලින් රු.1,422,353 ක් වැය කර තිබුණි. |

(ඉ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 8.3 වගන්තිය

සංස්ථාවේ සභාපතිවරයාගේ දේශිය නවාතැන් ගාස්තු වශයෙන් රු. 748,500 ක් සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබුණි.

(ii) 8.3.9 වගන්තිය

අමාත්‍යාංශයට අයත් ජංගම දුරකථන බිල්පත් නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව රු.61,187 ක් ගෙවා තිබුණි.

(ඊ) 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී 57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6 ඡේදය

මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව රු. මිලියන 2 ඉක්මවා පරිත්‍යාග ලෙස ගෙවීම් කළ නොහැකි වුවද, සමාලෝචිත වර්ෂයේදී රු.3,025,000 ක් පරිත්‍යාග කර තිබුණු අතර, පිරිවැය රු.2,705,147 ක් වූ අභ්‍යාස පොත්, අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා පරිත්‍යාග වශයෙන් ලබාදී තිබුණි.

## 2.4 ආර්ථික නොවන ගනුදෙනු

ඇගිලි සළකුණු යන්ත්‍ර 15 ක් මිලදී ගැනීමේදී පදනමකින් තොරව අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය ප්‍රතික්ෂේප කර හතරවන ස්ථානයට මිල ඉදිරිපත් කළ ආයතනයෙන් අදාළ මිලදී ගැනීම සිදුකර තිබීම නිසා රු.538,100 ක පාඩුවක් සිදු වී තිබුණි. මිලදී ගත් උපාංගවල තාක්ෂණික තත්ත්වය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක්ද සිදු කර නොතිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

#### (අ) මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.78,095,872 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා අනුරූපී බදු පූර්ව ශුද්ධ ලාභය රු.140,567,143 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.62,471,271 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළ ලාභය රු.මිලියන 20 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් රු.මිලියන 58 කින් වැඩිවීම මෙකී පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

#### 4.1.1 ආදායම

| ආදායම් ශීර්ෂ | 2013 | 2012 | විචලනය | | සියයට |
|---|---|---|---|---|---|
| | | | වාසි | අවාසි | |
| | (රු.000) | (රු.000) | (රු.000) | (රු.000) | |
| පාසල් පොත් ආදායම් (දඩ මුදල් අය කිරීමෙන් පසු) | 750,660 | 711,473 | 45,187 | - | 6 |
| වාණිජ මුද්‍රණ ආදායම් | 244,649 | 259,124 | - | (14,475) | (5.6) |
| අභ්‍යාස පොත් ආදායම් | 211,758 | 214,021 | - | (2,263) | (1.1) |
| අනිකුත් ආදායම් | 32,056 | 40,544 | - | (8,488) | (20.9) |

#### 4.1.2. නිෂ්පාදනය

| නිෂ්පාදන වර්ග | 2013 | | 2012 | | විචලනය | | සියයට | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඒකක | (රු.000) | ඒකක | (රු.000) | ඒකක | (රු.000) | ඒකක | (රු.000) |
| පාසල් පොත්(පිටපත් 000) | 9824 | 666,676 | 7,906 | 593,896 | 1918 | 72,780 | 24 | 12 |
| වාණිජ මුද්‍රණ (වැඩ සංඛ්‍යාව) | 799 | | 721 | | 78 | | | |
| අභ්‍යාස පොත් (පිටපත් සංඛ්‍යාව) | 10,140 | 140,718 | 10,571 | 145,593 | (431) | (4,875) | (4.1) | (3.3) |

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ වාණිජ මුද්‍රණ ආදායම් අභ්‍යාස පොත් ආදායම් හා අනිකුත් ආදායම් රු. මිලියන 26 කින් හෙවත් සියයට 5 කින් අඩු වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදන කිරීමට සැලසුම් කර තිබුණු අභ්‍යාස පොත් ඒකක සංඛ්‍යාව පොත් මිලියන 13.7 ක් වුවද තථ්‍ය වශයෙන් නිෂ්පාදනය කර තිබුණේ පොත් මිලියන 10.1 ක් පමණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියමිත දිනට පොත් මුද්‍රණය කර භාරදීමට නොහැකිවීමත්, නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවීමත් මත 2012, 2013 හා 2014 වර්ෂවලට අදාළ පාසැල් පොත් මුද්‍රණ කටයුතු සඳහා ලැබිය යුතු ආදායමෙන් රු. 40,966,014 ක් දඩ මුදල් වශයෙන් ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) සංස්ථාවේ සෑම මුද්‍රණ කාර්යයකදීම වැදගත් හා මූලික කාර්යයක් වන වර්ණ විභේදන ක්‍රියාවලිය (ColourSeperation work) 2009 වර්ෂයේ සිට බාහිර ආයතන මගින් ඉටුකර ගෙන තිබූ අතර මේ සඳහා 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා බාහිර ආයතන වෙත රු. 22,336,329 ක් ගෙවා තිබුණි. මෙකී කාර්ය සඳහා 2004 වර්ෂයේදී රු.9,514,302 ක් වැයකර යන්ත්‍රයක් මිලට ගෙන තිබුණද එය 2009 වර්ෂයේදී එනම් වර්ෂ පහක් වැනි අඩු කාලයකදී එම යන්ත්‍රය ක්‍රියා විරහිත වී තිබුණි. යන්ත්‍රයේ ඵලදායී ජීවිතකාලයෙන් අඩක්ගත වීමටත් පෙර යන්ත්‍රය ක්‍රියාවිරහිත තත්ත්වයට පත්ව තිබුණු අතර යන්ත්‍රය මිලදීගත් ආයතනයෙන් අලුත්වැඩියා කර ගැනීමට හෝ මෙම කාර්යය ඉටු කර ගැනීම සඳහා නව යන්ත්‍රයක් මිලදී ගැනීමට හෝ කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ සමස්ථ අලෙවි කටයුතු සඳහා අලෙවිකරණ සැලැස්මක් සකස් කර නොතිබූ අතර අභ්‍යාස පොත් සහ ලිපිද්‍රව්‍ය අලෙවි ඉලක්කයන් දැක්වෙන සැලැස්මක් පමණක් සකස් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අභ්‍යාස පොත් නිෂ්පාදනය සැලසුම් කළ නිෂ්පාදන ඉලක්කයන්ට ළඟාවීමට නොහැකි වී තිබුණු අතර සැලසුම් කළ නිෂ්පාදන ඉලක්කයන් ට ළඟාවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේදී අභ්‍යාස පොත් නිෂ්පාදනයට අවශ්‍ය මූලික අමුද්‍රව්‍ය එනම් සුදු ලියන කඩදාසි (860 mm / 60Gsm) වාර්ෂික නිෂ්පාදනයට මිලදී ගැනීම සඳහා සැලසුම් කළ ප්‍රමාණය වූ මෙ.ටො. 962 න් මෙ. ටො. 286 ක් එනම් සියයට 29 ක් පමණ නිසිපරිදි සැපයීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 සහ 2013 වර්ෂවලදී රු. 31,727,140 ක් වැය කර පෞද්ගලික ආයතනයකින් මිලට ගෙන තිබුණු යන්ත්‍ර අමතර කොටස් වලින් 2013 දෙසැම්බර් 31 දින වන විටත් රු.23,859,240 ක් වූ යන්ත්‍ර අමතර කොටස් අළුත්වැඩියාව සඳහා යොදාගෙන නොතිබුණි. උපරිම ධාරිතාවයකින් යන්ත්‍රවල නිෂ්පාදනය ඉහළ නැංවීම මෙම මිලදී ගැනීමේ අරමුණ වුවද, මිලදී ගැනීම නිමකර වසරකට වැඩි කාලයක් ගතවී තිබියදීත් අමතර කොටස් මිලදී ගැනීමේ අරමුණ ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 6 සිට වර්ෂ 15 දක්වා කාලපරාසයක් තුළ මිලට ගෙන තිබුණු රු. 2,118,090 ක් වූ අමතර කොටස් තොගයක් හා අවශ්‍යතාවය පිළිබඳ නිසි ඇගයීමක් නොකර මිලදී ගැනීම හේතුවෙන් 2011 වර්ෂයේදී මිලට ගෙන තිබුණු රු. 1,288,748 ක් වූ අමතර කොටස් තොගයක් 2014 දෙසැම්බර් අවසානය දක්වා භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර උපයෝජන වාර්තා අනුව සංස්ථාවේ යන්ත්‍ර නිෂ්ක්‍රීයව පැවති කාලය අයවැයගත පැය ගණනට සාපේක්ෂව සියයට 35 ක් සියයට 78 ක් දක්වා ඉතා ඉහළ පරාසයක් ගෙන තිබුණි.යන්ත්‍ර නිෂ්ක්‍රීය පැය 113.6 න් පැය 84.3 ක් එනම් සියයට 74 ක් වැඩ නොමැතිවීම නිසාත්, පැය 10.2 ක් එනම් සියයට 9 ක් යන්ත්‍ර ක්‍රියාවිරහිතවීම නිසාත්,පැය 13.6 ක් එනම් සියයට 12 ක් සේවකයන් නොමැතිවීම නිසාත් නිෂ්ක්‍රීයව තිබුණි.

(ඇ) ප්‍රමාණවත් වැඩ නොමැතිවීම හේතුවෙන් ලිතෝ, අකුරු ඇමුණුම් හා බයින්ඩින් අංශවල යන්ත්‍ර 06 ක් සමාලෝචිත වර්ෂය මුළුල්ලේ නිෂ්ක්‍රියව පැවතුණි.

(ඊ) ලිතෝ, ප්‍රොසෙස් කම්පියුටර්, ලෙටර් ප්‍රෙස් අංශයන්හි පවතින යන්ත්‍ර 05 ක් වර්ෂ කීපයක සිට ක්‍රියා විරහිතව පවතින නමුත් ඒවා අලුත් වැඩියා කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් අනුගමනය කර භාවිතා කිරීමට පියවර නොගැනීම නිසා නිෂ්ක්‍රීයව පැවතුණි.

(උ) Gsm 58 කඩදාසියෙන් නිෂ්පාදනය කරනලද විවිධ ප්‍රමාණයන් ගෙන් යුත් වටිනාකම රු.1,190,056 ක් වූ අභ්‍යාස පොත් තොගයක් දුර්වර්ණ වෙමින් , ඇමුණුම් කටු මල බැදෙමින් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්වෙමින් ගබඩාවේ නිෂ්ක්‍රීයව තබා ඇති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂවල වාර්තා මඟින්ද මේ පිළිබඳව අනාවරණය කර ඇති නමුත් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කළමනාකරණය අපොහොසත්ව තිබුණි.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

---

2010 වර්ෂයේ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී සිදුවී තිබුණු රු. 224,278 ක් වූ මුදල් ඌනතාවය සහ රු.222,205 ක් වූ තොග ඌනතාවය අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම වෙනත් අයවිය යුතු මුදල් යටතේ දක්වා තිබුණි.

**4.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

---

(අ) රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව වර්ග 6 කට අයත් සුදු මුද්‍රණ කඩදාසි වෙබ් රීල් මෙට්‍රික් ටොන් (මෙ.ටො.) 2381.255 ක් සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 11 ක දී රු.මිලියන311.5 ක් වැයකර මිලට ගෙන තිබුණි. මින් අවස්ථා 7 ක දී මිලදී ගන්නා ලද මෙ.ටො. 1784.507 ක් හෙවත් සියයට 75 ක් දේශීය නියෝජිතයකු මඟින් විදේශීය සමාගමකින් රු.මිලියන 234 .6 කට මිලට ගෙන තිබුණි.

- දේශීය නියෝජිතයා ලෙස කටයුතු කළ සමාගමේ හිමිකරු සංස්ථා සභාපතිවරයාගේ හිටපු පෞද්ගලික සහකාරවරයෙකු බව අනාවරණය වූ අතර මෙම සමාගම නමින් කටයුතු කිරීමට 2007 අංක 7 දරන සමාගම් පනතේ 184 වගන්තිය ප්‍රකාරව අධිකාර බලය පවරා නොතිබුණු බාහිර පුද්ගලයෙකු මගින් ටෙන්ඩර් ඉදිරිපත් කර තිබුණි. එසේ වුවත් මෙසේ ව්‍යාජ ලෙස ඉදිරිපත් කර තිබුණු ටෙන්ඩරය නීත්‍යානුකූල නොවීම නිසා, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8 වගන්තිය ප්‍රකාරව ටෙන්ඩර් මංඩලය විසින් ලංසු ප්‍රතික්ෂේප කිරීමට කටයුතු නොකර, මෙකී සැපයුම්කරුගෙන් රු. මිලියන 234.6 ක් වූ කඩදාසි මිලට ගෙන තිබුණි.

(ආ) ණයවර ලිපි ආරම්භ කර මාසයක් ඇතුළත කඩදාසි ගබඩාවට සැපයුම් කළයුතු වුවද, සැපයුම්කරු වෙත ලබා දී තිබූ රු. මිලියන 200.5 ක් වූ ටෙන්ඩර් 6 කට අයත් භාණ්ඩ සැපයීම දින 12 සිට දින 45 දක්වා ප්‍රමාද කර තිබුණි. එසේ වුවත් ප්‍රමාද කාලය වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. කඩදාසි සැපයීම ප්‍රමාද වීම හේතුවෙන් 2014 වර්ෂයේ පාසැල් පෙළපොත් 09 ක් නියමිත කාලයට මුද්‍රණය කර සැපයීමට සංස්ථාවට නොහැකිවීම නිසා රු.8,660,931 ක් වූ දඩ මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. එමෙන්ම කඩදාසි ප්‍රමාද වී ලැබීම නිසා සැලැසුම් කළ මුද්‍රණ කටයුතු අතැහැර දැමීම නිසා රු. 25,062,432 ක් වූ කඩදාසි මෙ.ටො.205 ක් මාස 8 ක් පමණ නිෂ්කාර්ය තොග බවට පත්ව තිබුණි.

(ඇ) අභ්‍යාස පොත් නිෂ්පාදන කටයුතු සඳහා රු.32,717,360 කට මිලට ගෙන තිබුණු කඩදාසි තොගයකට අදාළව රු. 2,660,490 ක කාර්යසාධන බැදුම්කරය නියමිත කාලය ඉකුත් වීමට පෙර නිදහස්කර තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.4.1 වගන්තිය අනුව අවශ්‍ය විධිමත් අනුමැතීන් ලබාගැනීමට ප්‍රමාණවත් කාලයක් සැලසෙන පරිදි ලංසු ඇගයීම සිදුකළයුතු වුවද, සුදු මුද්‍රණ කඩදාසි මෙ.ටො. 125 ක් මිලට ගැනීමට අදාල ලංසු ඇගයීම ප්‍රමාද කිරීම නිසා හතරවන මිල ඉදිරිපත් කළ ඉහත ආයතනයෙන් මිලට ගැනීමට සිදුවීම නිසා රු. 1,299,726 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

## 4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සම්පත්

සංස්ථාවේ සේවකයින් 10 දෙනෙකු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයට හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට මුදාහැර තිබුණු අතර ඔවුන්ගේ වැටුප්, අතිකාල සහ අනිකුත් දීමනා රු.3,018,894 ක් ප්‍රතිපූර්ණය කරගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථා පනතට පටහැනිව උප සභාපති තනතුරක් ඇතිකර ඒ සඳහා නිලධාරියකු පත්කර තිබුණු අතර එම නිලධාරියාට දීමනා, දුරකථන බිල්පත් සහ විදේශ ගමන් සඳහා රු. 768,191 ක් ගෙවා තිබුණු අතර කුළී පදනම මත වාහනයක් ද ලබාදී තිබුණි. එසේම විධිමත් අනුමැතියකින් තොරව (HM 1-1 ) මෙහෙයුම් කළමනාකරු යනුවෙන් නව තනතුරක් ඇතිකරගෙන ඒ සඳහා නිළධාරියකු බඳවාගෙන තිබුණි.

(ආ) සංස්ථාවේ අනුමත තනතුරු 686 න් පුරප්පාඩු 118 ක් පිරවීමට කටයුතු කර නොතිබුණු අතර බඳවාගෙන තිබුණු අතිරික්ත සේවකයින් 32 ක් බඳවාගැනීමට විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. අනියම් පදනම මත සේවකයින් 03 ක්ද කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 57 ක්ද තාවකාලික සේවකයින් 38 ක්ද අනුමත සේවක සංඛ්‍යාවෙන් බැහැරව බඳවාගෙන තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව මධ්‍යම පළාත් අලෙවි සංවර්ධන නියමු ව්‍යාපෘතියේ අලෙවි ප්‍රවර්ධන නිළධාරි තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත පුද්ගලයෙකු බඳවා ගෙන තනතුර සඳහා නිශ්චිත රාජකාරි පැවරීමකින් තොරව මාසිකව රු.20,000 ක දීමනාවක් ගෙවා තිබුණු අතර ඔහුගේ රු.50,412 ක් වූ ජංගම දුරකථන බිල්පත් ද සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ඈ) සංස්ථාවේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවා ගෙන තිබුණු නිලධාරියා වෘත්තියට හා බඳවාගැනීමට බලපාන කරුණු තෝරාගත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට වසන්කර සිටීම සම්බන්ධයෙන් පසුව අනාවරණය වී තිබුණද අදාල නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.9 වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 අප්‍රේල් 08 සහ 2013 අප්‍රේල් 17 දිනැති, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක පීඊ/කෝප්/37/ජීඊඑන් දරන ලිපි අනුව 2013 වර්ෂය සඳහා වාහන මිලට ගත යුත්තේ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැයට හා ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව වුවද, සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ඇස්තමේන්තු අනුව වාහන 02 ක් මිලදී ගැනීමට රු. 10,000,000 ක් වෙන් කර තිබුණු ප්‍රතිපාදන ඉක්මවා වාහන 02 ක් මිලදී ගැනීම සඳහා රු. 17,630,000 ක් වැය කර තිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.5 වගන්තියට අනුව සංස්ථාවේ සභාපතිවරයාට එක් වාහනයක් පමණක් නිලරථයක් වශයෙන් භාවිතා කළ යුතු වුවද, සභාපතිවරයා විසින් නිලරථයට අමතරව තවත් වාහන 03 ක් භාවිතාකර තිබුණි. සභාපතිවරයා භාවිතා කළ වාහනවල ඉන්ධන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 509,566 ක් ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ඇ) 1999 ඔක්තෝබර් 08 දිනැති, අංක 22/99 දරන රාජ්‍යපරිපාලන චක්‍රලේඛයේ 1:1:6(V) ඡේදයට අනුව නිල ප්‍රවාහන පහසුකම් සඳහා හිමිකම් නොලබන සංස්ථාවේ ආයතන කළමනාකාර තනතුරේ වැඩ බලන නිලධාරියෙකුට වාහනයක් ලබාදී 2011 ජනවාරි මාසයේ සිට 2013 ඔක්තෝම්බර් දක්වා රු. 1,320,000ක වාහන කුළී මුදලක් සහ රු.1,141,655 ක ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි.

(ඈ) 2010 ජූලි 15 දිනැති අංක 5034 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු වැඩ බලන අලෙවි ප්‍රවර්ධන නිලධාරීට 2010 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් දක්වා ඉන්ධන දීමනා ලෙස රු.558,023 ක් ගෙවා තිබුණු අතර, බිල්පත් සඳහා මුදල් ලබා ගැනීමේදී ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) සංස්ථාවේ ආරක්ෂක කළමනාකරුට ලබා දී තිබුණු මෝටර් සයිකලය 2013 පෙබරවාරි මාසයේදී භාවිතයෙන් ඉවත් කරන ලෙසට නිර්දේශ කර තිබුණද, එය සංස්ථාවට භාර නොදී නිල නිවසේ රඳවා ගෙන ධාවනය කිරීම වෙනුවෙන් ධාවන සටහන් නොමැතිව රු.36,254 ක් ඉන්ධන වියදම් ලෙස ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ඊ) මුදල් රෙගුලාසි ප්‍රකාරව සියලුම වාහන සඳහා ලොග් සටහන් පොත් පවත්වා ගෙන යා යුතු වුවත්, සංස්ථාවේ වාහනවලට අදාල ලොග් සටහන් පොත් විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

සංස්ථාවේ 2009- 2013 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව එම සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැය ගත හා තථ්‍ය ශේෂ අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වුයෙන් අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.3 විගණන කමිටු

2013 අගෝස්තු 28 දින පැවැත්වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ණය පදනම මත අලෙවි කරනු ලබන අභ්‍යාස පොත්වලින් අයවිය යුතු ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතු බව හා ඒ පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් සකස්කළ යුතුබව යෝජනා කෙරුණද ඒ අනුව කටයුතු කර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපතිවරයා වෙත වරින්වර දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අයවැය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ලැබිය යුතු ගිණුම්
(ඈ) ණයගැති පාලනය
(ඉ) ප්‍රසම්පාදනය
(ඊ) කාරක ප්‍රාග්ධන කළමනාකරණය
(උ) වාහන පාලනය
(ඌ) සේවක මංඩල කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.ගි.ප්‍ර)

(අ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 02

ඉදිරි වර්ෂවලදී තොගවල අගය, ශුද්ධ උපලබ්ධි අගය දක්වා ලියා අඩුකළ ආකාරය මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කිරීමට පියවර ගනු ලැබේ.

(ආ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 07

2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව ඉදිරිපත් කරනු ලැබේ.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 08

මෙහිදී සිදු කොට ඇත්තේ පෙර පැවති ගිණුම් ප්‍රමිත අංක 10 අනුව, වැරදි නිවැරදි කිරීමේ ගැළපුම් අයභාර සංචිත ගිණුමේ ඉදිරියට ගෙන ආ ශේෂයට ගැළපීමයි. එය අතීතානුයෝගීව මූල්‍ය තත්ව ප්‍රකාශනයට ගැළපීම් කිරීමේදී ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්වය ප්‍රතිෂ්ඨාපනය වීම සිදු වේ.

(ඈ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 16

සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති, තව දුරටත් භාවිතයට ගනු ලබන වත්කම්වල වර්ගීකරණයේ සංයුතිය පිළිබඳ සටහනක් මූල්‍ය ප්‍රකාශනවල අංක 3.1 මගින් දක්වා ඇත.

(ඉ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 23

2013 වර්ෂය සඳහා මෙවැනි වියදම් හඳුනාගත නොහැකි වූයේ, වසර තුළදී කරන ලද සෑම ණය ගැනීමක්ම අමුද්‍රව්‍ය ආනයනය වෙනුවෙන් කරන ලද නිසා ඒවා ප්‍රාග්ධනිත කළහොත් අතාත්වික වන බැවිනි.

(ඊ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 39

ඉදිරියේදී මූල්‍ය වත්කම් සාධාරණ අගයට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කිරීමට කටයුතු යොදනු ඇත.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ණය ගැතියන් ඇතුළුව මූල්‍ය වත්කම් සාධාරණ අගයට **(Fair Value)** මූල්‍ය තත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කිරීමේදී, මෙලෙස මුළු වෙළඳ ණය ගැතියන්ගෙන් ප්‍රතිශතයක් බොල් හා අඩමාණ ණය ලෙස වෙන් කරනු වෙනුවට, එක් එක් ණය ගැතියාගෙන් ලැබිය යුතු ශේෂය අය කර ගැනීමේ හැකියාව සැලකිල්ලට ගෙන මෙම වෙන් කිරීම සිදු කරනු ලැබේ.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

2012 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපණය කරන ලද ලාභය නිවැරදි නොවන බව විගණනය විසින් වාර්තා කරන ලද බැවින්, එය පසුව නිවැරදි කොට සංශෝධිත ආදායම් බදු ගණනය කිරීම **(Revised Tax Computation)** දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී. අදාළ ආර්ථික සේවා ගාස්තු වට්නාකමද මේ වන විට නිරවුල් කොට ඇත.

### 2.2.4 නොසැසඳූ පාලන ගිණුම්

මෙම ගිණුමේ බැර ශේෂය විකුණුම් පාලන ගිණුම හා සැසඳීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

### 2.2.5 පැහැදිලි නොකරන ලද වෙනස්කම්

(අ) නිවැරදි උපලේඛනය පිළියෙල කොට ඇති අතර, එය විගණනයට ඉදිරිපත් කළ හැක.

(ආ) මෙම සම්පූර්ණ ශේෂයම පාසල් පොත් සැපයීම වෙනුවෙන් ඇති වූවක් නොවන අතර, ඉන්වොයිස් පොත් මුද්‍රණය කිරීම වැනි අනෙකුත් මුද්‍රණ කටයුතු වෙනුවෙන් ලැබිය යුතු මුදල් ද මෙහි ඇතුළත්ය. මෙම ශේෂය සනාථ නොකළද, පැරණි ණය අයකරගැනීමේ වැඩපිළිවෙළ යටතේ අදාළ ලියකියවිලිවල අඩුපාඩුකම් සම්පූර්ණ කොට මෙම ශේෂයද අයකර ගැනීමට පියවර ගනු ලැබේ.

(ඇ) ඒ. කනගරත්නම් නම් වූ මෙම ණය ගැතියාගේ ලෙජර් කාඩ් පතෙහි එකතු කිරීමේ දෝෂයක් නිසා 2013. 12. 31 දිනට ශේෂය රු. 1,645,936/= ක් ලෙස දක්වා තිබූ අතර, සනාථ කිරීම සඳහා යවා තිබුණේ මෙම ශේෂයයි. එහෙත් රු. 493,662/= ක් වූ මෙම එකතු කිරීමේ දෝෂය නිවැරදි කළ විට අදාළ කාඩ් පතෙහි නිවැරදි ශේෂය, ණය ගැතියා විසින් සනාථ කරන ලද ශේෂය වන රු. 1,152,224/=ක වටිනාකමට සමානය. මේ පිළිබඳව විගණනයට පැහැදිලි කරන ලදී.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

ශේෂ තහවුරු කිරීම් සෘජුවම රජයේ විගණන අධිකාරීවරයාට ලැබෙන පරිදි, ණය ගැතියන් 141 දෙනෙකු වෙත ශේෂ තහවුරු කිරීම් කැඳවීමේ ලිපි යවන ලද නමුදු, තහවුරු කිරීම් ලැබීම සංස්ථාවේ පාලනයෙන් බැහැර වූ දෙයකි. (මෙම ශේෂ තහවුරු කිරීම් කැඳවීමේ ලිපිවල පිටපත් ඇතුළත් ලිපි ගොනුව විගණනය වෙත භාර දී ඇත.)

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) මෙලෙස වෙළඳ ණයගැති ශේෂය වර්ධනය වීමට හේතු වූයේ එහි අන්තර්ගත අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ශේෂයෙහි වූ අසාමාන්‍ය වැඩි වීමයි. 2013 වසරේ පොදු රාජ්‍ය මණ්ඩල සමුළුව පැවති සමයේ මහා භාණ්ඩාගාරය විසින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත අරමුදල් මුදා හැරීම ප්‍රමාද වීම මෙම තත්ත්වය උද්ගත වීමට හේතු විය. 2012. 12. 31 දිනට රු. 297,111,782/= ක් වූ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ණය ගැති ශේෂය මෙම ප්‍රමාදය නිසා 2013. 12. 31 දිනට රු. 560,291,280/= ක් විය. එබැවින් මෙම ශේෂය හැර සෙසු වෙළඳ ණය ගැතියන්ගේ සාපේක්ෂ වර්ධනය වන්නේ 18% ක් පමණි. කෙසේ වෙතත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේ අප්‍රේල් සහ මැයි මාසවලදී හිඟ මුදල් ද ඇතුලුව අදාළ ඉන්වොයිස් පත් නිරවුල් කරන ලදී.

(ආ) ණය ගැතියන්ගෙන් ණය මුදල් අයකර ගැනීම සඳහා වෙනම ම ගණකාධිකාරීවරයෙක් පත් කර ඇති අතර, 2014 වසරේ පටන් අවශ්‍ය අවස්ථාවන්හිදී ණය ගැතියන් පෞද්ගලිකව හමු වී ඉන්වොයිස්පත් හා අදාළ ලියකියවිලි ඉදිරිපත් කොට වර්ෂ 1 කට වඩා පැරණි ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීමේ ක්‍රමවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කොට ඇත.

(ඇ) ඉහත සඳහන් වැඩ පිළිවෙළ හරහා මෙම 100%ක් අයකර නොගත් ණය ගැතියන් වෙත ද අවසාන සිහි කැඳවීම් යවා තවදුරටත් අදාළ ණය ගැතියන්ගෙන් කොටසක් හෝ අයකර ගැනීමට හැකිදැයි සොයා බැලීමට උපදෙස් දී ඇත.

(ඈ) මේ සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනය සමග කිහිප අවස්ථාවක සාකච්ඡා පවත්වා ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ගෙවීම සිදු කිරීමට එම ආයතනයේ පාලක සභාව අනුමැතිය ලබා දෙන ලදී. එහෙත් අදාළ පොත් තොගයෙන් සමහරක් සඳහා ඔවුන් විසින් භාණ්ඩ ලැබීමේ සටහන් (GRN) පත් නිකුත් කර නොතිබීමෙන් ඒවා භාරදුන් බවට භාරදීමේ නිවේදන (Dispatch Advises) අප සතු ව නොතිබීමත් නිසා ගෙවීම ප්‍රමාද වී ඇත. මෙම ගැටලුව නිරාකරණය කොට මුදල් ලබා ගැනීමට මෙම වසරේදී කටයුතු කරනු ඇත.

(ඉ) මෙම සංස්ථාව වෙත සපයනු ලබන අබලි කඩදාසි වෙනුවෙන් මුදල් ගෙවීමක් සිදු නොකරන අතර එයට හිලවු වන සේ ෆයිල් කවර (Case Cover) ඇතුළු අනෙකුත් ලිපි ද්‍රව්‍ය අවශ්‍යතාවයන් සපුරා ගනු ලැබේ. ඒ පිළිබඳව පසුගිය වසර 02 හි දේශීය අමුද්‍රව්‍ය සැපයුම් පරීක්ෂා කළ හොත් මෙය මනාව පැහැදිලි වේ. ජාතික කඩදාසි සංස්ථාව විසින් සිය නිෂ්පාදන සැපයීම ආරම්භ කළ විට මෙම ශේෂය දේශීය සැපයුම් ගිණුම හරහා නිරවුල් වේ.

(ඊ) ● අනුරාධපුර අලෙවිසැලෙහි කාර්යභාර නිලධාරී විසින් කිසිදු ඇප සුරක්ෂිතයක් නොගෙන මහේෂ් වල්ගම නැමැත්තාට ණය ලබාදීම සිදුකර ඇත. මහේෂ් වල්ගම නැමැත්තා දිගින් දිගටම ගණුදෙනු කිරීමෙන් හිඟ මුදල් අතපසුවීමකින් තොරව ගෙවීම් කිරීමත්, ඔහුගේ භාර්යාව පත්වීමක් ලබා අනුරාධපුර අලෙවිසැලෙහි සේවය කිරීමත් යන විශ්වසනීය කාරණය මත ප්‍රධාන කාර්යාලයේ අලෙවි අංශය දැනුවත් කිරීමක් නොමැතිව ණයට ලබාදීම ආරම්භ කර ඇත.

● අලෙවිසැලේ කාර්ය භාර නිලධාරී විසින් අනුරාධපුර පොලිස් අධිකාරී කාර්යාලය හරහා ද සාමාන්‍යාධිකාරීවරයා විසින් සෘජුවමද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදුකරන කැඳවීම් අනුව ඉදිරි කටයුතු ඉටුවනු ඇත.

● 2012. 12. 31 දිනට රු. 7,256,521.00 ක මුදලක් අයවීමට තිබුණි. 2013.12.07 වන විට එය රු. 5,491,302.10 දක්වා අඩුව තිබුණි.

(උ) අයි. ජී. ඒ. බණ්ඩාර මහතා අභ්‍යාස පොත් අලෙවි කටයුතු සිදුකරන මුල් කාලය තුළ විකුණුම් අනුව සංස්ථාවට මුදල් ගෙවා තිබුණි. සාමාන්‍යයෙන් අභ්‍යාස පොත් වැඩිපුර අලෙවිවන වසර අගදී විශාල මුදලක් සඳහා ඇප තැබීම අපහසු වීම හේතුවෙන් ගිවිසුමක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

(ඵ) වසර 3 කට වඩා පැරණි ණය හිමියන්ගෙන් අදාළ මුදල් පිළිබඳව තවදුරටත් හිමිකම් පෑමක් සිදු නොවුනහොත් 2014 වර්ෂය අවසානයේ දී එම ශේෂයන් ආදායමට බැර කිරීමට අදාළ ගිණුම් සටහන් යොදනු ලැබේ.

## 2.4 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153,155 සහ 160 වගන්ති යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පනවා තිබූ රඳවා තබා ගැනීමේ බදු **(Withholding Tax)** බලාත්මක වූ කාලයේදී, ගණුදෙනුකරුවන් විසින් සෘජුවම මෙම බද්ද සංස්ථාව වෙනුවෙන් ගෙවීම නිසා, රුපියල් මිලියන 25 කට අධික මුදලක් 2010 වසර වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වැඩිපුර ගෙවා තිබුණි. මේ පිළිබඳව සමථයකට පත් කර ගන්නා තෙක් අනෙකුත් බදු මුදල් නොකඩවා ගෙවීමෙන් සංස්ථාවේ ද්‍රවශීලතාවයට අහිතකරව බලපාන බැවින් අදාළ මුදල් රඳවා ගැනීමට එවකට පැවති කළමනාකාරිත්වය තීරණය කරන ලදී.

(ආ) ඉහත 2.4 (අ) හි පැහැදිලි කරන ලද පරිදි, ජාතිය ගොඩනැගීමේ බදු ද සංස්ථාවේ රඳවා ගන්නා ලද අතර, එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදුවලට අදාළ බදු වාර්තා **(Tax returns)** පමණක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

(ඇ) සභාපතිතුමාගේ නිල රථයට ලබාදුන් අත්තිකාරම් මුදල පියවීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) 2010. 10. 11 වන දින මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් විදේශ ගමන් සඳහා හිමි දීමනා සහ ඒ ආශ්‍රිත වියදම් යන මැයින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක මු.ක්‍ර.අ 01/2010/01 දරන චක්‍රලේඛය අනුව මෙම වියදම් ගෙවන ලදී. මෙම චක්‍රලේඛයේ හැඳින්වීම කොටසෙහි මීට අදාළ අනෙකුත් චක්‍රලේඛ මෙයින් සංශෝධනය වන බව සඳහන්ව ඇත. එබැවින් ගරු අග්‍රාමාත්‍යතුමාගේ අනුමැතිය පරිදි සභාපතිතුමා මෙම විදේශ සංචාරයෙහි නියැලී ඇත.

මෙම චක්‍රලේඛය පරිදි දීමනා ගණනය කිරීමේ පදනම ගුවන් ගමන් විස්තර ආදිය ඉදිරිපත් කොට ඇත. මේ සම්බන්ධයෙන් විදේශ මුදල් ලබා ගෙන ඇත්තේ සෘජුවම බැංකුව මගිනි. මෙම විස්තර ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආකෘති **1 (Form 1)** අනුව අදාළ බැංකුව වෙතය. අදාළ විස්තර නොමැතිව කිසිදු බැංකුවක් විසින් විදේශ මුදල් මුදා හරිනු නොලැබේ. මෙම තොරතුරු හා ලියකියවිලි විගණනය වෙත ඉදිරිපත් කළ හැක.

(ඉ) **(i)** ඉහත පැහැදිලි කළ පරිදි නවාතැන් පහසුකම් සඳහා ගෙවන ලද ගාස්තුවල එකතුව වන රු. 748,500/=ක මුදල ගෙවා තිබුණේ රාජ්‍ය අනුග්‍රාහකත්වය ඇති බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව අනුබද්ධිත සවරින්ග් කෝපරේෂන් හෝටලයේ කාමරයක් සඳහා වට්ටම් මිලකටය.

**(ii)** සංස්ථාව අයත් වන රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් අනුව දුරකථන බිල්පත් ගෙවා ඇත.

(ඊ) රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් විසින් රාජ්‍ය උත්සව පැවැත්වීමේදී ඔවුන් සතු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින්, අප ආයතනය වෙතින් කරන ලද ඉල්ලීම් අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පරිත්‍යාග ගෙවීම් සිදුකරයි. රාජ්‍ය ආයතන අදාළ චක්‍රලේඛවලට අනුගතව රාජකාරි කටයුතු සිදු කළත් රාජ්‍ය උත්සව සහ වෙනත් ආගමික කටයුතු වැනි උත්සව අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් අනුග්‍රහයක් ඉල්ලූ විට අපගේ නිෂ්පාදන සම්බන්ධයෙන් ප්‍රචාරණයක් ලබා ගැනීම, අලෙවි ප්‍රවර්ධන කටයුතු නංවාලීම වැනි කරුණු සලකා බලා, අදාළ අනුග්‍රහයන් පිරිනමන ලදී.

ඒ අනුව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ආරියරත්න ඇතුගල මහතා විසින් නිෂ්පාදනය කළ "මහාසමයම" ගීත නාටකය ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද "වෙසගේ මහා ගීත ගෝවින්දය" හා බුද්ධ ශාසන අමාත්‍යාංශය විසින් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට සංවිධානය කරන ලද "රාජ්‍ය වෙසක් උත්සවය" වෙනුවෙන් අප ආයතනයේ අනුග්‍රහයෙන් රු. මිලියන 1 බැගින් පිරිනමන ලද අතර, 2013. 05. 16 දින පවත්වන ලද 737 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මේ සඳහා අනුමැතිය ලැබී ඇත.

මහනුවර ඓතිහාසික ශ්‍රී දළදා මාලිගාවේ වාර්ෂික දළදා පෙරහැර මංගල්‍යය වීදි සංචාරය කරන අවස්ථාවේ දී SPC අභ්‍යාස පොත් ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා ශ්‍රී විෂ්ණු මහා දේවාලයට සභාපතිතුමාගේ මූල්‍ය අධිකාරී බලය අනුව රු. 25,000/= ක අනුග්‍රහයක් දක්වන ලදී.

2011. 02. 11 දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක 57ට අනුව රු. ලක්ෂයකට වඩා වැඩි මූල්‍ය අනුග්‍රහ සඳහා ගරු මුදල් අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගත යුතු බව සඳහන් කර ඇති බැවින් පහත දක්වා ඇති රු. 100,000/= ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇති බව ද කාරුණිකව දන්වා සිටිමි.

මෙහිදී අලෙවි ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් සිදුකරන ලද සියලුම ප්‍රදානයන් රාජ්‍ය ආයතනවල පොදු කටයුත්තක් හෝ සමාජ සුභ සාධක කටයුත්තක් සඳහා සිදු කරන ලද ප්‍රදානයන් වන අතර පුද්ගලික ආයතනවලට සිදු කරන ප්‍රදානයන් නොවේ. තව ද රු. 100,000/= වඩා අඩු ප්‍රදානයන් PED 57 චක්‍රලේඛයට අනුගතව සිදු කර ඇති අතර 2014 වසරේ සිට අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා සිදුකරන සියලු ප්‍රදානයන් චක්‍රලේඛවලට අනුගතව සිදු කරනු ලැබේ.

## 2.4 ආර්ථික නොවන ගණුදෙනු

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව සඳහා උක්ත මිලදී ගැනීම සඳහා මීට පෙර දෙවතාවක්ම ටෙන්ඩර් කැඳවන ලද නමුත් ඒවා අසාර්ථක වීම හේතුවෙන් තුන්වන වරටත් නැවත ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් ටෙන්ඩර් කැඳවා සුදුසු සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා අවස්ථාව සලසා ගන්නා ලදී.

එහිදී සැපයුම්කරුවන් 5 දෙනෙකු මිල ගණන් ඉදිරිපත් කරන ලද අතර එයින් සුදුසු සැපයුම්කරුවකු තෝරා ගැනීමට ප්‍රථම අදාළ සැපයුම්කරුවන් වෙන වෙනම ගෙන්වා ඔවුන්ගේ ඉදිරිපත් කිරීම (Demonstration) තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ලබා ගන්නා ලදී. එහිදී පැහැදිලි වූ කරුණු අනුව අවම මිල සඳහන් සැපයුම්කරුවන්ගේ අඩුපාඩු හේතුවෙන් එම මිල ගණන් ප්‍රතික්ෂේප කරන ලදී.

දෙවන ඉහළ මිල ඉදිරිපත් කරන ලද ET Lab ආයතනය සමග කරන ලද සාකච්ඡාවේදී ඔවුන් විසින් ඇඟිලි සලකුණු යන්ත්‍ර පමණක් සපයන බවත් වැටුප් සැකසීමේ මෘදුකාංගය වෙනත් ආයතනයකින් රැගෙන ලබා දෙන බවත් දන්වා සිටින ලදී.

තුන්වන ඉහළ මිල ඉදිරිපත් කරන ලද Exel Trading ආයතනය සමග කරන ලද සාකච්ඡාවේදී සමහර අයිතමයන් (උදා : UPS Voice Prompt) ලබා නොදෙන බවත් එවිට SPC පිරිවිතරයන්ට නොගැළපෙන බවත් පෙනී යන ලදී. එබැවින් එම මිල ගණන් ප්‍රතික්ෂේප කරන ලදී.

හතරවන ඉහළ මිල ඉදිරිපත් කරන ලද Micro Device ආයතනය SPC පිරිවිතරවලට හරියාකාරව ගැළපෙන අයුරින් මිල ගණන් ඉදිරිපත් කර තිබූ බැවින් එම මිල ගණන් සඳහා ටෙන්ඩරය පිරිනැමීමට තීරණය විය.

පස්වන ඉහළ මිල SPC පිරිවිතරයන්වලට උචිතව සකසා ඇතත් මිල වැඩිවීම හේතුවෙන් ප්‍රතික්ෂේප කරන ලදී.

ET Lab Manufacturing (Pvt) Ltd ආයතනයේ ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ලබාදුන් පිරිවැය රු. 1,241,000/= ලෙස දක්වා ඇත. වැටුප් සැකසීමේ මෘදුකාංගය සඳහා වැයවන රුපියල් 350,000/= මුළු මුදලට එකතු කර නොමැත. ඒ අනුව වැටුප් සැකසීමේ මෘදුකාංගයේ වටිනාකම ටෙන්ඩර් පත්‍රිකාවට ඇතුළත් කර මුළු මුදලට එකතු නොකිරීමෙන් තහවුරු වන්නේ ඒ සම්බන්ධයෙන් අවධානය යොමු නොකර ඇති බවයි. ටෙන්ඩර් විවෘත කිරීමෙන් පසු ඒ සම්බන්ධව 2012. 07. 30 ලිපියෙන් දැන්වුවද ඇගයීමට භාජනය කළ නොහැකිය.

මේ අවස්ථාව වන විට මීට ඉහත දී දෙවරක්ම මෙලෙස ටෙන්ඩර් කැඳවා අදාළ සැපයුම්කරුවන් සමග සාකච්ඡා කර තිබූ බැවින් තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් මේ පිළිබඳව දැනුවත්ව සිටීම නිසා විශේෂඥ සහාය අවශ්‍ය නොවිණි.

**ET Lab** ආයතනය පැමිණීමේ, පිටවීමේ යන්ත්‍ර පමණක් රාජ්‍ය ආයතන සහ වෙනත් ආයතන සඳහා ලබාදී තිබූ නමුත් වැටුප් සැකසීමේ මෘදුකාංගය ලබා දී නැත. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව විසින් පැමිණීම හා පිටවීම වැටුප් සැකසීම යන කාරණා සියල්ල සඳහා මෘදුකාංග එකම ආයතනයකින් ලබා ගැනීමට බලාපොරොත්තු වූ බැවින් එම අංග සියල්ලම එකම ආයතනයකින් ලබා ගැනීම සඳහා සලකා බලන ලදී. **ET Lab** ආයතනයෙන් ඇඟිලි සලකුණු යන්ත්‍ර නිෂ්පාදනය කර කාලයක් ඒවා පමණක් සපයා ඇති බවට වන සේවා වාර්තාව රාජ්‍ය ආයතන සඳහා සපයා ඇති සේවා වාර්තාවත් සැලකිල්ලට ගත්තද ඒවා අදාළ කාර්ය සඳහා ප්‍රමාණවත් නොවේ.

ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයෙන් සේවක මහතුන්ගේ පැමිණීම හා පිටවීම ඇතුළත් කර වැටුප් සැකසීමේ මෘදුකාංගයක් භාවිතයෙන් වැටුප් සැකසීම සහ වෙනත් වාර්තා ලබා ගැනීම අප ආයතනයට අලුතෙන් හඳුන්වා දීමකි. 2013 පෙබරවාරි මාසය වන විට එක් මාසයක් ඒ අනුව වැටුප් ගෙවා තිබූ අතර ඉන්පසු එහි අඩුපාඩු 2013. 02. 15 දින වන විට **Micro Device** ආයතනය වෙත කළමනාකාර (පරි. හා මානව සම්පත් සං.) විසින් දන්වා ඇත. ජනවාරි මාසයේ සිට ඉදිරි මාස සඳහා වැටුප් ගෙවා තිබූ බැවින් ඉදිරි අඩුපාඩු සාකච්ඡා කර සකස් කර ගත හැකි බැවින් 2013. 06. 17 දින තාක්ෂණික ඇගයීම් කමිටුව ගෙවීම නිර්දේශ කර ඇත.

ඉදිරියේදී පද්ධතිය ක්‍රියාත්මක කරන්නන්ට හා භාවිත කරන්නන්ට යන දෙපිරිසගේම දුෂ්කරතා අවම වේ.

## 3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

(අ) පසුගිය වර්ෂ තුනෙහි දී කෙටි කාලීන ණය ලබා ගැනීම වැඩිවුවද ඊට සමගාමීව කාර්ය සාධනය වර්ධනය කර ගැනීමට සංස්ථාවට හැකි විය. 2010 වසර හා සසඳන විට 2011 දී 21% කින් මුළු පිරිවැටුම වැඩිකර ගැනීමට හැකි වූ අතර, ප්‍රමාණවත් අමුද්‍රව්‍ය තොග මට්ටමක් පවත්වාගත් නිසා, පෙළ පොත් මුද්‍රණ ඇණවුම ලද වහාම මුද්‍රණ කටයුතු ආරම්භ කළ හැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස කිසිදු ප්‍රමාදයකින් තොරව දිවයින පුරා 2012 වසර වෙනුවෙන් වූ පෙළ පොත් බෙදා හැරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සමත් විය.

(ආ) ප්‍රශස්ත මට්ටමක **(Optimum Level)** තොග පවත්වා ගැනීම තුළින්, 2012 නිෂ්පාදනය වෙනුවෙන් ප්‍රසම්පාදනය කළ යුතු වූයේ අඩු අමු ද්‍රව්‍ය ප්‍රමාණයකි. ඒ අනුව 2011 වසර හා සසඳන විට 17% කින් අඩු කෙටි කාලීන ණය ප්‍රමාණයකින් 2012 දී නිෂ්පාදන කටයුතු කළ හැකි විය. 2012 වසර හා සසඳන විට 2013 වසරේදී 7% කින් මුළු පිරිවැටුම වර්ධනය විය. මෙහි සඳහන් සමස්ත කාල පරිච්ඡේදය වන 2010 වසරට සාපේක්ෂව 2013 වසරේ පිරිවැටුම 34% කින් වැඩිකර ගත හැකි වූයේ වෙනත් කිසිදු අරමුදල් සම්පාදන මාර්ගයකින් නොව, කෙටි කාලීන බැංකු ණය තුළින් පමණි.

(ඇ) මෙම විශ්ලේෂණයේ ණය ගැතියන් ද්‍රවශීලතාවයෙන් අඩු වත්කමක් ලෙස දක්වා තිබුණ ද, එයින් 68%ක්ම අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතුව තිබුණු ශේෂයයි. 2014 වර්ෂයේ අප්‍රේල් සහ මැයි මාසවලදී හිඟ මුදල් ද ඇතුළුව අදාළ ඉන්වොයිස්පත් නිරවුල් කරන ලද බැවින් ජංගම අනුපාතය පෙර වර්ෂවලට සාපේක්ෂව වර්ධනය වී ඇත.

(ඈ) ණය ගැතියන්ගෙන් ණය මුදල් අයකර ගැනීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩ පිළිවෙළ හරහා 100%ක අයකර නොගත් ණයගැතියන් වෙත ද අවසාන සිහි කැඳවීම් යවා, තවදුරටත් අදාළ ණය ගැතියන්ගෙන් කොටසක් හෝ අයකර ගැනීමට හැකිදැයි සොයා බැලීමට කටයුතු කරනු ලැබේ. ඉහත 3.2 (ඇ) හි පැහැදිලි කළ පරිදි 2013. 12. 31 දිනට පැවති ණය ගැතියන්ගෙන් 68%ක්ම 2014 අප්‍රේල්, මැයි මාසවන විට උපලබ්ධි වී ඇති බැවින් මෙහි සඳහන් ආකාරයේ ජංගම වගකීම පියවීමේ ගැටලුවක් පැන නැගී නොමැති බව මනාව පැහැදිලි වේ.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) ප්‍රමාද දඩ සඳහා කඩදාසි ලැබීමේ ප්‍රමාදයන් පමණක් නොව වෙනත් සාධක ද බලපායි. මෙහිදී සෝදුපත් ප්‍රමාද වී අනුමත කිරීම්, මුද්‍රණ කටයුතු සිදුකරන අවස්ථාවලදී සංශෝධන ඇතුළත් කිරීම්, වර්ණ ගැන්වීම්වලදී ඇතිවන වෙනස්කම් සඳහා අවශ්‍ය කටයුතු කිරීම් ආදිය ද වේ. මෙහිදී අදාළ දිනට පෙළ පොත් ලබාදීම මෙන්ම නියම ආකාරයට වර්ණ ගැන්වීම් සම්බන්ධයෙන් ද විශේෂ සැලකිල්ලක් යොමු කරයි. කෙසේ වෙතත් ඉහත කාරණාද සැලකිල්ලට ගෙන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් ප්‍රමාද වූ දින ගණන් සඳහා සහන කාලයක් ද ලබා දේ. විශේෂයෙන්ම 2013 වසර සඳහා සමහර පොත්වලට මාසයකට ආසන්න සහන කාලයක් ලබා දී ඇත.

රාජ්‍ය මුද්‍රණ ආයතනයක් ලෙස (රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථා පනතට අනුව) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට අවශ්‍ය හදිසි පොතක් හෝ පොත් කිහිපයක් මුද්‍රණය කර බාරදීම සඳහා ප්‍රමාණවත් කඩදාසි තොගයේ තබා ගැනීම සාධාරණවන අතර, තොගයේ කඩදාසි යම් ප්‍රමාණයක් වැඩිපුර තිබීමෙන් ඊළඟ වසර ආරම්භයේ පෙළ පොත් මුද්‍රණය සඳහා ලැබීමත් සමගම මුද්‍රණ කටයුතු ආරම්භ කිරීමට ද හැකි වේ. ඒ අනුව ලැබිය හැකි ප්‍රමාද දඩ ප්‍රමාණය අවම කළ හැකිය.

මෙම තොග සඳහා රාජ්‍ය බැංකුවකට යම් පොලියක් ගෙවීමට සිදු වුවද ජාතික කර්තව්‍යයක් ලෙස සිදු කරන පෙළ පොත් මුද්‍රණයේදී හදිසි ඇණවුමක් ඉටුකර දීමට නොහැකි වුවහොත් එය පාසල් ළමුන් සඳහා සිදුවන බලවත් අසාධාරණයක් මෙන්ම එම අදාළ තොග තබා ගැනීම දඩ මුදල් ප්‍රමාණය අවම කිරීමට ගන්නා උත්සාහයක් ද වනු ඇත.

(ආ) දක්වා ඇති වර්ණ විභේදන යන්ත්‍රය 2004 මාර්තු මාසයේ මිලදී ගෙන ඇත. එයින් නිෂ්පාදන කටයුතු ඉතා සාර්ථකව ඉටුකරගත් අතර 2009 පෙබරවාරි මස ආපදාවක් ඇති වීමෙන් පසු නිෂ්පාදන කටයුතු සඳහා යොදවා ගැනීමට නොහැකි වී ඇත.

මෙම ආපදාව දේශීය අලෙවි නියෝජිතයෙකු වන **JDC** ආයතනය වෙත දැනුම් දී ඇති අතර විශේෂ පුහුණුව ලත් කාර්මිකයින් දෙදෙනකු ඒ සඳහා නැවත පැමිණ පරීක්ෂා කර බලා ඒ සඳහා රු. 2,104,200/= **+VAT** ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත. නමුත් මේ මාදිලියේ යන්ත්‍ර නිෂ්පාදන කටයුතු නවතා ඇති බැවින් ඒ සඳහා අමතර කොටස් නිෂ්පාදනය නොකරන බවත් ඉහත ඇස්තමේන්තුව පිළිගෙන ආපදාවක් නිම කලත් ඒ සඳහා වගකීම් කාලයක් ලබාදිය නොහැකි බවත් දන්වා ඇත.

ඉන්පසු මෙම යන්ත්‍ර අලුත්වැඩියාව සඳහා පරීක්ෂා කිරීමට වෙනත් විදුලි ඉංජිනේරුවරයෙකුට බාරදුන් නමුත් අමතර කොටස් නොමැති වීමෙන් අලුත්වැඩියා කිරීමට නොහැකි විය. පසුව මුද්‍රණ යන්ත්‍ර සම්බන්ධ විශේෂ විදුලි ඉංජිනේරු මහතෙකු (මාර්ක් ප්‍රනාන්දු) වෙත භාර දුන්නද ඔහුටද මෙම යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට නොහැකි විය.

දැනට වර්ණ විභේදන යන්ත්‍ර භාවිතයේ නොමැති බැවින් ඉතාමත් දියුණු තාක්ෂණයකින් යුතු **CTP** යන්ත්‍රයක් ලබා ගැනීමට 2011 ජූලි මාසයේදී උත්සාහ කළද එය අසාර්ථක විය. නමුත් ඉදිරි කාලයේ දී මිලට ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

### 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) මුද්‍රණ සැලසුමට අනුව වාර්ෂික කඩදාසි අවශ්‍යතාවය මෙ.ටොන් 958කි. මෙ.ටොන් 674ක් 2013 වර්ෂයේ ලබාගත් අතර පසුගිය වසරෙන් මෙ.ටොන් 174ක් ඉතිරිව තිබිණි. ඒ අනුව මෙ.ටොන් 848ක් මෙම වසරේ අභ්‍යාස පොත් නිෂ්පාදනය සඳහා යොදවා ඇත.

නිෂ්පාදන සැලැසුම සකස් කළද යම් යම් හේතු මත ක්‍රියාත්මක කිරීමේදී වෙනස්කම් සිදුවේ. වසර අවසාන භාගයේ සමහර පොත් සඳහා වැඩි ඉල්ලුමක් ඇති වීමෙන් හිගයක් පෙන්වුවද නිෂ්පාදිත පොත් සියල්ලම පාහේ අලෙවි කිරීමට හැකි විය.

## 4.4 නිෂ්ක්‍රීය ඌණ උපයෝජිත වත්කම්

(අ) 2009, 2010 සහ 2011 වසරවල විගණන වාර්තාවල දිගින් දිගටම පෙන්වා දී තිබුණේ සංස්ථාවේ යන්ත්‍ර ඌණ උපයෝජනයක් පවතින බවය. ඊට ප්‍රධානතම හේතුව වූයේ සංස්ථාව සතු ඉතා පැරණි මුද්‍රණ යන්ත්‍ර නිතර නිතර ආපදාවට ලක් වීමයි. එබැවින් යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට අවශ්‍ය සියලු අමතර කොටස් ලබා දී සම්පූර්ණ අලුත්වැඩියාවක් **(Comprehensive Repair)** සිදු කිරීමෙන් මෙය වළක්වා ගැනීම මෙම අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනයේ අරමුණ විය.

සංස්ථාවේ ප්‍රධානතම නිෂ්පාදන කටයුත්ත වන පාසල් පෙළ පොත් මුද්‍රණයට බාධා නොවන අයුරින් මෙම අලුත්වැඩියාවන් සිදු කළ යුතු බැවින් මෙලෙස කාලයක් ගත විය. 2014 වසරේ පාසල් පොත් මුද්‍රණ කටයුතු නිම වූ වහාම, ඉතිරි අමතර කොටස් යොදා ගෙන අලුත්වැඩියා කටයුතු නිම කිරීමට අපේක්ෂිතය.

එක් එක් යන්ත්‍රය වෙනුවෙන් වෙන් වෙන්ව අමතර කොටස් හඳුනා ගැනීමෙන් අනතුරුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව මෙම මිලදී ගැනීම සිදු කරන ලදී. යන්ත්‍ර නිතර නිතර ආපදාවට ලක්වීම නිසා පෙළ පොත් මුද්‍රණ කටයුතු ප්‍රමාද වීමෙන් දැරිය යුතුවන ප්‍රමාද දඩ මුදල බැංකු අයිරා සහ කෙටි කාලීන ණය පොලිය ද ඉක්මවා යන බැවින් මෙම ප්‍රසම්පාදන කටයුත්තට මුදල් වැය කරන ලදී. 2014 වසරේ පාසල් පොත් මුද්‍රණ කටයුතු නිම වූ වහාම ඉතිරි අමතර කොටස් යොදා ගෙන අලුත්වැඩියා කටයුතු සිදු කරන බැවින් මෙම අමතර කොටස් තොගය ඌණ උපයෝජිත වත්කම් ලෙස සැලකිය නොහැක.

(ආ) මෙම නියැදි පරීක්ෂාවට භාජනය වී ඇති අමතර කොටස් සමහර ඒවා තනි තනිව සවි කිරීමට නොහැකි අතර ඒවා කාණ්ඩ වශයෙන් භාවිත කිරීමට සිදුවේ. එබැවින් මේ දක්වා කිසිදු අවස්ථාවකදී භාවිත නොවූ පමණින්ම, ඒවා අනවශ්‍ය යැයි සහතික විය නොහැක. තවද දැනට සංස්ථාවේ භාවිත කරනු ලබන මුද්‍රණ යන්ත්‍ර වසර 30 කට වඩා පැරණි බැවින් ඒවා නිපදවනු ලැබූ මව් සමාගම් **(Parent Companies)** වලින් පවා මෙවැනි අමතර කොටස් වර්තමානයේ දී මිලදී ගැනීමට නොහැක. ඒ අනුව අවශ්‍ය වූ වහාම ඒවා ලබා ගැනීමේ හැකියාවක් නොමැත. මෙම නියැදි පරීක්ෂාවට භාජනය වී ඇති මුළු අමතර කොටස් සංඛ්‍යාව 64ක් වන අතර එහි වටිනාකම රු. මිලියන 3.4 කි. සංස්ථාවේ භාවිත කරනු ලබන මුද්‍රණ යන්ත්‍රවලින් ලැබෙන වාර්ෂික නිමැවුම් වටිනාකම හා සසඳන විට මෙම අමතර කොටස් වටිනාකම ඉතා සුළුය.

(ඇ) යන්ත්‍රවල වැඩ නොමැති වීම නිසා නිෂ්ක්‍රීය වීම ඉහතින් සඳහන් කර ඇත. යන්ත්‍ර ඉතා පරණ නිසා යන්ත්‍ර ක්‍රියා විරහිත වීම හේතුවෙන් ද නිෂ්ක්‍රීය කාලය වැඩි වේ.

(ඈ) සැලසුම් කළ පරිදි ප්‍රධාන යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට අපහසු වුවහොත් (ආපදා තත්ත්වය මත, අමුද්‍රව්‍ය හිඟතාවයක් මත හෝ අමතර කොටස් හිඟ තාවයක් මත) අනෙකුත් යන්ත්‍රවල ක්‍රියාකාරිත්වයන්හි ද අක්‍රමවත් බවක් ඇති වේ. එවැනි අවස්ථාවන්හිදී මෙම යන්ත්‍ර ද භාවිතයට ගැනීම සිදු වේ.

(ඊ) මෙම යන්ත්‍ර ඉතාමත් පරණ, මුද්‍රණ කටයුතු සඳහා යෙදිය නොහැකි මුද්‍රණ යන්ත්‍ර වේ. මෙම යන්ත්‍ර නැවත පිළිසකර කරන්නේ නම් විශාල මුදලක් වැය විය හැකි අතර එසේ වියදම් කළහොත් වෙනත් ප්‍රශ්න ඇති විය හැකිය.

(උ) පිටු 80 වැඩ පොත් තොගය ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා නොමිලයේ බෙදා දීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

2013 දෙසැම්බර් 31 දිනට තොග විචලතා ගිණුමෙහි ඇතුළත් රු. 222,205/= තොගය 2010 වර්ෂයේ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී සිදු වී ඇති ඌණතාවයකට අදාළව ඉදිරියට ගෙන ආ ශේෂයකි. රේඛීය අමාත්‍යාංශය විසින් මේ පිළිබඳව විමර්ශනයක් සිදු කරනු ලබන අතර, එහි වාර්තාව අනුව අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

මෙම මුදල් ඌණතාවය පිළිබඳව රේඛීය අමාත්‍යාංශය විමර්ශනයක් සිදු කරනු ලබන අතර එහි වාර්තාව ලැබීමෙන් පසු අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

## 4.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) ප්‍රසිද්ධ ටෙන්ඩරයක් මගින් ලැබුණු අදාළ ලංසු පරීක්ෂා කර තාක්ෂණික කමිටුවේ ඇගයීම් වාර්තාව මත කඩදාසි මිලදී ගැනීම සිදු කරනු ලබයි. තාක්ෂණික කමිටුවේදී විශේෂයෙන් මුද්‍රණ කඩදාසි මිලදී ගැනීමේදී සැලකිය යුතු කාරණා කීපයක් ඇති අතර කඩදාසිවල පිරිවිතරයන්හි සමහර පිරිවිතරයන් සීමාවන් බැහැර කිරීම්වලට ලක් කිරීමට ද සිදු වේ. එසේ සිදුවන්නේ ආයතනයට සිදුවන මූල්‍ය පාඩුව සලකා බලාය. **J. R International** ආයතනය ලංසු ඉදිරිපත් කිරීමේ දී ජී. එස්. එම්. සම්බන්ධව ප්‍රකාශකර ඇති ප්‍රකාශන අනුව දෙවන ලංසුව ඉදිරිපත් කර ඇති **S. S. Trading** ආයතනයට ලංසුව පිරිනැමුවේ නම් රු. 612,428.25 ක පාඩුවක් අප ආයතනයට සිදුවේ. තවද ඉහත **J. R. International** ආයතනය (මෙහි අයිතිකරු සභාපතිවරයාගේ හිටපු පුද්ගලික සහකාර නොහොත් ඉහළ ගෙදර අබේසිංහ බණ්ඩාර නොවන අතර මීට පෙර මුද්‍රණ කඩදාසි සපයන ලද **Jupiter Trading** ආයතනයේ කාර්ය මණ්ඩලයේ හිටපු රෙක්සි පෙරේරා යන අයයි) ජී. එස්. එම්. සම්බන්ධව ඉදිරිපත් කර ඇති ප්‍රකාශය තවත් විගණන විමසුමකට ලක්විය හැකි කාරණයකි. පළමුවන හා දෙවන ලංසුකරුවන්ගෙන් කුමන ලංසුකරුට මෙය පිරිනැමුවද එය විගණන විමසුමකට ලක්වන කාරණයක් බව හොඳින් දන්නා අතර අඩුපාඩු ඉදිරිපත් කරන ලද වෙනත් ලංසු පිළිගැනීමකට නොහැකි බැවින් හා ආයතනයට සිදුවන මූල්‍ය වාසිය සලකා එම ලංසුව පිරිනමන ලදී.

(ආ) මිලදී ගන්නා ලියන කඩදාසි තොගය ලැබුණු පසු කඩදාසියේ ජී. එස්. එම්. අගය හා පැහැය සුදුසු බව තහවුරු කිරීමෙන් පසු රීල් එකක් යොදා යන්ත්‍රය සඳහා සුදුසුද යන්න පරීක්ෂා කර බලා සුදුසු හෝ නුසුදුසු බවට ලිඛිතව නිෂ්පාදන අංශය මගින් සැපයුම් අංශය දැනුවත් කරයි. ඉන්පසු ටෙන්ඩර් ලිපි ගොනුවේ ඉදිරි කටයුතු සිදු කරයි. ඒ අනුව 2013 ජූනි මස 17 දී සුදුසු බව තහවුරු කර තොග භාවිතය 2013 ජූලි 01 සිට ආරම්භ කර ඇත.

(ඇ) කාර්ය සාධන බැඳුම්කරයට අදාළ භාණ්ඩ ගබඩාවට ලැබුණු පසු එය නිෂ්පාදනයට මුදා හැර, සපයන ලද අමුද්‍රව්‍යයන්හි ගුණාත්මක භාවය නිෂ්පාදන අංශයෙන් සතුටුදායක භාවය සම්බන්ධයෙන් පිළිබඳව තහවුරු කිරීමේ ලිපියක් ලබාගත් පසු කාර්යසාධන බැඳුම්කරය මුදාහැරීම සාමාන්‍ය ක්‍රියාපටිපාටියයි.

(ඈ) අභ්‍යාස පොත් හා සී. ආර්. පොත් සඳහා එක් එක් නිෂ්පාදකයා විසින් ඉතා තරගකාරී ලෙස ගුණාත්මයෙන් ඉහළ ඉතා ආකර්ෂණීය නිමැවුමකින් යුතුව පොත් වෙළඳ පොළට නිකුත් කරයි. පිරිවිතරවල අවම තිබිය යුතු ගුණාංග සඳහන් කළද, වාණිජ කටයුත්තක් සඳහා යොදා ගැනීමේදී වඩාත් හොඳ පෙනුමෙන් යුත් පොත් වෙළඳ පොළට යොමු කළ යුතුයි. මෙහිදී අවම ලංසුවට වඩා දෙවන ලංසුවේ මුළු ඇස්තමේන්තු පිරිවැය රු. 52,290/= වුවද එය එක් පොතක් නිෂ්පාදනයට යාමේදී ශත තුනකට අඩු අගයක් ගනී. මෙම ශත තුන වැඩියෙන් ගෙව්වද එමගින් එම පොත් වෙළඳ පොළට නිකුත් කිරීම නිසා සිදුවන ලාභය ඊට වඩා වැඩිවන බව අවධාරණය කර තාක්ෂණික කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව ඉහත තීරණය ගෙන ඇත.

**PR** සැපයුම් අංශයට යොමු කර ඇත්තේ 2013. 11. 13 වන දින අතර මෙය ඉතා හදිසි අවශ්‍යතාවයක් ලෙසට කරුණු දක්වා ඇත. ඒ අනුව ගතහැකි හොඳම විකල්පය ලෙසට ඉහත ටෙන්ඩරයෙන් 50%ක් ප්‍රති ඇණවුමක් සිදුකර ණයවර ලිපි විවෘත කර දින 16ක් තුළදී කඩදාසි නැවිගත කර සැපයීම සිදු කර ඇත.

**PR** පත්‍රය ඉදිරිපත් කර දින 42 ක් තුළදී කඩදාසි සපයා ඇත. ප්‍රතිඇණවුමක් සිදුකර මෙය ලබා නොදුනහොත් ඒ සඳහා අවම ලෙස මාස 04ක කාලයක් ගත වේ.

## 4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සම්පත්

මේ සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත්කර එහි අනුමැතිය පරිදි අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත ලිඛිතව දැනුම් දීමක් කර ඇත.

අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි මෙම සේවකයින් අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත.

එසේ අනුයුක්ත කර ඇති සේවකයින්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය කරනු ලබන නිලධාරියා විසින් අතිකාල හා වෙනත් දීමනා සහතික කර ඇත. තවද, එම අනුයුක්ත කර ඇති ස්ථාන වල ඉටු කරනු ලබන රාජකාරී කටයුතු සඳහා වැටුප් ගෙවීම කර ඇත.

නිදහස් කර ඇති ආයතනයේ ඉටු කරන සේවාව අනුව එම කාල වකවානුවේ එම අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශ කරනු ලබන අතිකාල ප්‍රමාණය ගෙවීමට සිදු වී ඇත.

අමාත්‍යාංශයට මුදාහැර ඇති සේවකයින්ගේ අතිකාල සේවය අධීක්ෂණය කරනු ලබන නිලධාරින්ගේ නිර්දේශයන් සලකා සභාපතිතුමා විසින් පෞද්ගලිකව ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව අනුමත කරනු ලැබේ.

### 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ නව අධ්‍යක්ෂ මණ්ඩලය පත්වීමෙන් පසු සභාපතිතුමාගේ රාජකාරී කටයුතුවලට සහාය වීමත්, අලෙවි කටයුතු දීප ව්‍යාප්තව සිදු කිරීමේ අරමුණත් පෙරදැරිකරගෙන අධ්‍යක්ෂ මණ්ඩලය එච්. කේ. ඩී. ලක්ෂ්මන් ගාමිණී මහතා උප සභාපති ලෙස පත් කර ගන්නා ලදී. තවද වසර 03 ක සේවා කාලය අවසන් වීමෙන් පසු 2013. 06. 18 දින නැවත වරක් එම තනතුරට ඔහු පත්කර ගත් අතර ඒ සෑම අවස්ථාවකදී ම ඊට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලේකම් තුමා වෙත යවන ලදී. එමෙන්ම උප සභාපති තනතුරට පත් කිරීම සම්බන්ධව ආවරණ අනුමැතිය ලබා ගැනීම සඳහා විෂය භාර අමාත්‍ය ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙත ද යවා ඇත.

තවද 1994. 10. 14 දින 532 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ ප්‍රතිපත්තිමය හේතූන් මත ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු පත් නොකරන බවත් ඒ වෙනුවට උප සභාපතිවරයෙකු- පමණක් පත්කර ගන්නා බවත් ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරට අදාළ දීමනාවන් හා අනෙකුත් පහසුකම් උප සභාපති තනතුර සඳහා ලබාදෙන බවත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ සඳහන් කර ඇත. ඒ අනුව මෙම පත්කර ගන්නා ලද උප සභාපතිවරයා ට ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු-ට ලබාදෙන සියලු වරප්‍රසාද ලබාදීමට කටයුතු කර ඇත.

පවතින අවශ්‍යතාවයන් පදනම් කරගෙන සේවා අවශ්‍යතාව සඳහා මෙහෙයුම් කළමනාකාර තනතුරක් ඇති කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. එහෙත් සේවා කටයුතු සඳහා සහකාර සැපයුම් කළමනාකාර මහතා එම තනතුරට අනුයුක්ත කර ඇත. එය අනුමත කිරීම ඔහුට පෞද්ගලික වනසේ සිදු කර ඇත.

(ආ) රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ බඳවා ගැනීමේ පරිපාටිය 2012. 09. 07 දින සිට අනුමතව ඇත. මෙම අනුමැතියට පෙර කාල සීමාවේ මෙම කළමනාකරණ අභ්‍යාසලාභීන් පුහුණුව සඳහා බඳවා ගැනීම සිදුකර ඇති අතර අදාළ පුහුණුවෙන් පසුව ඔවුන් පුහුණුව ලබන තනතුරට බඳවා ගැනීමට කටයුතු කළ යුතුව තිබිණි. මීට පෙර සංස්ථාවේ එවැනි ක්‍රමවේදයක් පැවති අතර නව බඳවා ගැනීමේ පරිපාටියෙන් අභ්‍යාසලාභීන් බඳවා ගැනීමට ප්‍රතිපාදන සලසා නොමැත. කෙසේ වුවද මෙම උසස්වීම් සඳහා වූ සම්මුඛ පරීක්ෂණයට මේ අයටද පෙනී සිටීමට අවස්ථාව ලබාදී තිබූ අතර මොවුන්ගේ විශේෂ පුහුණුව සැලකිල්ලට ගෙන කටයුතු කිරීමට සිදුව ඇත. මින් ඉදිරියට බඳවා ගැනීමේ පරිපාටියට අනුව කළමනාකරණ අභ්‍යාසලාභීන් බඳවා ගනු නොලැබේ.

උපාධිධාරී අභ්‍යාසලාභීන් පුහුණුවට බඳවා ගනු ලැබ ඇත්තේ මෙම නව ආයතනික ව්‍යුහය සහ බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීමට ප්‍රථමය. එබැවින් මෙම තනතුරුවලට ඒ වන විටත් පුහුණුවට බඳවා ගෙන සිටි අභ්‍යාසලාභීන්ගේ විශේෂ පුහුණුව සැලකිල්ලට ගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට හා එම පරීක්ෂණ මණ්ඩලයේ තීරණයට අනුව කටයුතු කිරීමට සිදුව ඇත.

(ඇ) අවශ්‍යතාව පදනම් කරගෙන තාවකාලිකව හා කොන්ත්‍රාත් පදනම මත අනවශ්‍ය වූ විට ඉවත් කිරීමට හැකිවන පරිදි මෙම පත්වීම සිදු කර ඇත. තවද, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව සකස් කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ 2012 වර්ෂයේ අනුමත වී ඇති අතර ඒ වන විට මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම හා බඳවා ගැනීම් සිදු කර තිබුණි.

හැකියාව මත මෙන්ම තාවකාලික පදනම මත පමණක් එම තෝරා ගැනීම සිදු කර ඇති අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන පත්වීම් සිදු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව මාසික දීමනාවක් හා සම්බන්ධීකරණ කටයුතු සඳහා මසකට රු. 1,500/= උපරිමයකට යටත්ව දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණයට ඉඩකඩ සලසා ඇත.

ක්ෂේත්‍රයේ ඉටු කරනු ලබන කටයුතු සඳහා සංස්ථාවේ අංක 54 - 4024 දරන කැබ් රථය ලබා දී ඇති අතර, ඒ සඳහා මසකට රු. 15,000/= උපරිමයකට යටත්ව ඉන්ධන ලබා දී ඇත. ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා මධ්‍යම පළාත තුළ සිදු කරන සංචාරවලදී සහ සංවර්ධන කටයුතුවලට සහභාගී වීම්වලදී අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය වැනි දෑ ලබා ගැනීම ද ඔහු විසින් සිදු කරයි.

(ඇ) මෙම අයදුම්කරු තෝරා ගැනීමෙන් අනතුරුව ඔහු විසින් ඉදිරිපත් කර ඇති ඥාතීන් නොවන තමා ගැන දන්නා නිලධාරීන් දෙදෙනෙකුගෙන් දුරකථනයෙන් විස්තර විමසා සිටියද මෙම නිලධාරියා වැඩ තහනමකට ලක්ව ඇති බවත් ඔවුන්ගෙන් අනාවරණය නොවුණි. කෙසේ වුවද තනතුර සථිර කරන අවස්ථාවේ දී අවශ්‍ය වන්නේ නම් පෙර සේවා ආයතනවලින් ලිඛිත වාර්තා ලබා ගැනීමෙන් අනතුරුව ඒ ගැන සැලකිල්ල යොමු කොට ඉදිරි කටයුතු කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳව අධිකාරියේ සේවා සහතිකයක් ඉදිරිපත්ව නොමැති බැවින් ඒ පිළිබඳව ලකුණු ලබා දීමට කටයුතු කර නොමැත. ඔහු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට කරුණු වසන් කර තිබීම සම්බන්ධයෙ-න් කරුණු විමසීමට ද කටයුතු කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමේ දී බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව නිර්ණායකයක් භාවිත කර ඇත. විධායක ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වර්ෂ තුනක පළපුරුද්දක් මෙම තනතුරට නියම කර තිබීමත් ගිණුම්කරණය විගණනය යන ක්ෂේත්‍රවල පළපුරුද්දට අතිරේකව ලකුණු ලබාදීමේ දී උපරිම වර්ෂ 10ක් දක්වා වර්ෂයකට ලකුණු 03 බැගින් ලබාදීම සැලකිල්ලට ගෙන ඇත. මෙහිදී තෝරාගත් අයදුම්කරු හා මාලා කුමුදුණී යන අය පිළිගත් ආයතනවල ගණකාධිකාරී ක්ෂේත්‍රයේ වසර 10කට වඩා සේවය කර තිබූ බැවින් ඔවුන්ට එම සම්පූර්ණ ලකුණු ප්‍රමාණය ලබාදෙන ලදී.

## 4.9 වාහන උපයෝජනය

(අ) 2013 වර්ෂය සඳහා සංස්ථාවේ ප්‍රාග්ධන අයවැය ලේඛනය අනුව විවිධ වාහන ශීර්ෂය යටතේ රු. මිලියන 10ක් සහ යතුරු පැදි 11ක් වෙනුවෙන් රු. මිලියන 1.5ක් ද වශයෙන් එකතුව රු. මිලියන 11.5 ක් මෝටර් වාහන වෙනුවෙන් වෙන් කරන ලදී. ප්‍රාග්ධන වියදම වෙනුවෙන් සංස්ථා අයවැය ලේඛනයෙන් මුදල් වෙන්කළ පමණින්ම ඒවා අදාළ වර්ෂය තුළ දී සිදු කිරීමට නොහැකිවන අවස්ථා ඇත.

ඒ අනුව 2012 වසරේ දී රු. 20,450,000/= මෝටර් වාහන වෙනුවෙන් වෙන් කළ නමුත් වැය කරන ලද්දේ සේවක ප්‍රවාහනය සඳහා මිලදී ගත් බස් රථ දෙක වෙනුවෙන් රු. 7,530,000/-= ක් පමණි. 2012 වසර අවසානය වනවිට වාහන වෙනුවෙන් වෙන් කර ගත් රු. 12,920,000/=- (රු.20,450,000/-= - රු. 7,530,000/=-) ක් ඉතිරිව පැවතුණි.

සභාපතිතුමා පරිහරණය කරන ලද මෝටර් රථය මිලදී ගෙන වසර 05 ක් ඉක්මවා ඇති බැවින් ඒ වෙනුවෙන් නව මෝටර් රථයක් මිලදී ගැනීමේ අවශ්‍යතාවය කලක පටන් පැවතුණි. තවද අනෙකුත් මෝටර් රථ ද ඉතා පැරණි බැවින් වාර්ෂිකව වාහන නඩත්තුව වෙනුවෙන් විශාල පිරිවැයක් දැරීමට සිදුවිය.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන මුදල් කළමනාකරු විසින් 2013.04.09 වන දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අංක 5398 දරන මණ්ඩල පත්‍රිකාවක් මගින් මෝටර් රථ සහ රු. මිලයන 9කට බෙදා හැරීමේ වෑන් රථයක් ද ඇතුළත් කළ හැකිවන පරිදි මෝටර් රථ සඳහා වන අයවැය ප්‍රතිපාදන රු. මිලියන 29ක් ලෙස සංශෝධනය කිරීමට අනුමැතිය ඉල්ලා ඊට අනුමැතිය ලබාගෙන ඇත.

සභාපතිතුමාගේ නිල රථය සඳහා රු. මිලියන 10ක් වැය කිරීමට අංක පීඊ/කෝප්/37/ජීඑන් සහ 2013.04.08 දිනැති ලිපියෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමැතිය ලබාදෙන ලදී. සාමාන්‍යාධිකාරීවරයාගේ නිල රථය සඳහා රු. මිලියන 08 ක් වැය කිරීමට අංක පීඊ/කෝප්/37/ජීඑන් සහ 2013.04.17 දිනැති ලිපියෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමැතිය ලබාදෙන ලදී. මෙම වාහන දෙක සඳහා අදාළ අනුමත පිරිවැය ඇතුළත 2013 වර්ෂයේ දී වාහන මිලදී ගැනීමට වැය කරන ලදී.

මෙම වාහන මිලට ගැනීම සංවිධානය කිරීම ආරම්භ වූයේ 2011 වසර අග භාගයේ වන අතර එවකට තිබූ වාහන මිල මට්ටම් මත ඇස්තමේන්තු සකසා ඇත. නමුත් වාහන මිල එම කාලයේ දී විශාල ලෙස ඉහළ ගිය නිසා ඇස්තමේන්තු මුදල වෙනස් වී ඇති නමුත් ඒ සම්බන්ධව අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අවසරය නිසි ලෙස ලබාගෙන ඇත.

ඉහත වාහනය සඳහා මුල සිටම **SUV** රථයක් (ජීප්) සඳහා ඉල්ලා ඇති අතර ඒ සඳහා නිසි අවසරය ලබාගෙන ඇත. 2013/02/22 හා 2013/04/09 යන දිනැති ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ දී මේ සම්බන්ධව සාකච්ඡා කර වඩාත් පිරිවිතර ගැළපෙන වාහනය ලෙසට **Hundai Santafe** වාහනය මූල්‍ය සීමා හා ඇන්ජින් ධාරිතාව යටතේ මිලට ගෙන ඇත. එම වාහනය තාක්ෂණික කමිටුව විසින් ප්‍රතික්ෂේප කර නොමැති අතර එය ඇන්ජින් ධාරිතාවය එවකට තිබූ සීමාව යටතේ ඉක්මවා ඇති නිසා නිර්දේශ කළ නොහැකි බව දක්වා ඇත. නමුත් පසුව ඒ සඳහා නිසි අවසරය ලබාගෙන ඇති නිසා එම තත්ත්වය සමනය වී එය යෝග්‍ය බවට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත.

(ආ) සභාපති නිල රථය ලෙස **KV** - 6172 වාහනය වෙන්කර ඇති අතර ඉතිරි වාහන 2 අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා වෙන්කර ඇත.

(ඇ) අමාත්‍ය සම්බන්ධීකාරක (කොන්ත්‍රාත්) ලෙස සේවය කරන ආයතන කළමනාකරණ තනතුරේ වැඩ බලන නිලධාරියාට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව ප්‍රවාහන පහසුකම් සපයා ඇති අතර සංස්ථාවේ ඒ සඳහා ලබාදීමට වාහනයක් නොවීම (ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් නොමැති වීම) හේතුවෙන් කුලී පදනම මත ලබාගත් වාහනයක් ලබා දීමට කටයුතු කර තිබුණි. මෙම වාහනයට මාසික කුලිය සහ ඉන්ධන වියදම් සංස්ථාවෙන් දරා ඇත.

(ඈ) අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව අලෙවි ප්‍රවර්ධන නිලධාරියෙකු තාවකාලික පදනම මත බඳවා ගෙන තිබූ අතර ඔහුට එම කටයුතු කිරීමට (ක්ෂේත්‍ර කාර්යයන් ඉටු කිරීම සඳහා) වාහනයක් ලබාදීමට කටයුතු කර ඇත. එම වාහනයට මසකට රු. 15000/=- ක උපරිමයකට යටත්ව ඉන්ධන ලබාදී ඇත.

(ඉ) සහකාර කළමනාකරු (ආරක්ෂක) වෙත රාජකාරී අවශ්‍යතාවය මත සපයා ඇති මෝටර් සයිකලය සංස්ථාව තුළ පිහිටි ඔහුගේ නිල නිවසේ රඳවා තැබීමට හැකියාවක් ඇත. මෙම මෝටර් සයිකලය භාවිතයට නුසුදුසු යැයි සංස්ථා කාර්මික මහතා නිර්දේශ කර ඇති නමුත් පසුව එය තරමක අලුත්වැඩියාවක් කොට භාවිතයට ගෙන ඇත. මේ සඳහා රාජකාරී අවශ්‍යතාවයට අනුව ඉන්ධන නිකුත් කොට ඇත. එහි ධාවන සටහන් පවත්වා ගැනීමට මොහුට උපදෙස් දී ඇත. එම සටහන් පොත මෝටර් සයිකලය පරීක්ෂා කළ දින ප්‍රධාන ආරක්ෂක මැදිරිය අසල දී සහකාර කළමනාකරු (ආරක්ෂක) විසින් විගණන නිලධාරී මහත්මියට ලබාදී ඇත. කෙසේ වෙතත් මෙම මෝටර් සයිකලය ආපසු සංස්ථාවට භාර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත.

(ඊ) සියලුම වාහනවල ලොග් සටහන් පොත් නඩත්තු විධිමත්ව සිදුකර නොතිබුණ ද මීට පෙර විගණන හා කළමනාකරණ කමිටුවල සාකච්ඡා කළ ආකාරයට වාහනවල ලොග් පොත් නඩත්තු කිරීම සඳහා කටයුතු කර ඇත. මිලදී ගනු ලැබූ නව වාහනවල සටහන් කිරීමට තරම් වූ කරුණු මෙම විගණනය වනතෙක් ඉදිරිපත් වී නොතිබුණි. දැනට මෙම ලොග් සටහන් පවත්වාගෙන යනු ලැබේ. මෙහි සඳහන් භාවිතයෙන් ඉවත් කිරීමට හඳුනාගෙන ඇති යතුරුපැදිවල ලොග් සටහන් පොත් දැනට යාවත්කාලීන කර නොමැත. කෙසේ වුවද වාහන භාර නිලධාරී විසින් ලොග් සටහන් පොත් නඩත්තු කිරීමේ කටයුතු කරමින් පවතී.

අදාළ විස්තර සහිතව ලොග් සටහන් පොත් නඩත්තු කිරීමට උපදෙස් දී ඇත.

## (5) ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

සංස්ථාවේ 2014 - 2016 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මට 2014.05.28 දින පැවති අංක 746 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා ගන්නා ලදී. අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව එම සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන කරනු ලැබේ.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

ඉදිරියේ දී අයවැය ලේඛන ඵලදායී කළමනාකරණ පාලන උපකරණයක් ලෙස භාවිත කිරීමේ අටියෙන් ඊට හේතු සහ පිළියම් ද සහිතව අයවැය ගත තොරතුරු සහ සත්‍ය තොරතුරු අනුව විචලනයන් කාලීනව සැසඳීමට පියවර ගනු ලැබේ.

### 5.3 විගණන කමිටු

මුදල් අංශය සෘජුවම මැදිහත් වී, අභ්‍යාස පොත්වලින් අය විය යුතු ණය මුදල් කාලීනව අයකර ගැනීමට පියවර ගෙන ඇත.

## 6. පද්ධති හා පාලනයන්

මෙහි (අ) සිට (එ) දක්වා ඇති පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරනු ඇත.

